රාජ්‍ය **ආයතන** හා සේවාවලට **ආබාධ** සහිත කාන්තාවන් සඳහා **ඇති** ප්‍රවේශය පිළිබඳ තක්සේරු වාර්තාව

අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක් ආශ්‍රයෙන්

සිදු කරන ලද අධ්‍යයනයකි.

ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය







2023 සැප්තැම්බර්

ආසියා පදනම සහ කැනේඩියානු රජයේ මූල්‍ය අනුග්‍රාහකත්වය යටතේ නිම කරන ලද මෙම තක්සේරු වාර්තවේ අඩංගු අදහස් එහි කතුවරයා සතුය. මහේ දක්වා **ඇති** අදහස් **ආසියා** පදනම හෝ කැනේඩියානු රජයේ අදහස් පිළිඹිබු නොකරයි.

ස්තුතිය පුද කිරීම

මමෙ අධ්‍යයනය සාර්ථක කර ගැනිම සඳහා අදාල තොරතුරු සපයමින් සිය නොමසුරු සහයෝගය පළකළ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් ලේකම් එන්. එම්. එන්. රුවන් බණ්ඩාර නවරත්න මහතා, දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරී තිමල් ලියනආරච්චි මහතා, දිස්ත්‍රික් වනිතා සංවර්ධන නිලධාරිනී තක්ෂිලා රණවිර මහත්මිය සහ දිස්ත්‍රික් රාජ්‍ය නොවන සම්බන්ධිකරණ නිලධාරී සුමිත් රත්නායක මහතාටත්; අනුරාධපුර නැගෙනහිර නුවරගම් පලාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන ග්‍රාම නිලධාරී ආර්.එම්.සී.රත්නායක මහතා,සමාජ සේවා නිලධාරිනී ඩබ්ලිව්. එම්. තුෂාරි මහත්මිය, නගර සභාව (මධ්‍යම වළෙඳ සංකීර්ණය) ප්‍රධාන ආදුයම් පරීක්ෂක එම්.ජී.සි. සනත් මහතා සහ එහි පුස්තකාලාධිපති කේ.ජී.අයි.සමතපාල මහතා, නගරාධිපති එච්.පී.සෝමදස මැතිතුමා යන මහත්ම මහත්මීන්ට; අනුරාධපුර මානව හිමිකම් කොමිෂන් සභා දිස්ත්‍රික් සම්බන්ධීකාරිකා ඩබ්ලිව්. කේ. ශිරෝමි ප්‍රියංගා මහත්මිය, අනුරාධපුර මහජන බැංකු කළමණාකරු ජී.එම්.නිස්ස කුමාර මහතා, අනුරාධපුර ශ්‍රී ලං.ග.ම ඩිපෝවේ සහය කළමණාකාර යූ. ඩබ්ලිව්. බෝධාවල මහතා, අනුරාධපුර උසාවි සංකීර්ණයේ රජෙස්ටාර් ශ්‍රියාණි ඉන්දරලතා මහත්මිය, අනුරාධපුර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ආර්. ඒ. එන්. විජේසිංහ මහතා සහ එහි කාන්තා හා ළමා අංශ ස්ථානාධිපති යමුනා කාන්ති මහත්මිය, තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් සුමිත් කේ. සෝමරත්න මහතා, වනිතා සංවර්ධන නිලධාරිනී කේ. එම් ප්‍රදීපිකා මහත්මිය, සමාජ සේවා සංවර්ධන නිලධාරී එස්. එන්. එස්. බී. එස්. එම්. සේමසිංහ මහතා තඹුත්තේගම මූලික රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී වෛද්‍ය එන්.එච්. ධර්මතිලක මහතා, තඹුත්තේගම පොලිස් ස්ථානාධිපති එන්. ජේ. අනුකෝරල මහතා සහ කාන්තා පොලිස් පරීක්ෂක ජී.එන් දමයන්ති මහත්මිය, තඹුත්තේගම මහජන බැංකුවේ කළමණාකාර එස්. පී. කේ. ඒකනායක මහතා, තඹුත්තේගම මහේස්ත්‍රාත් උසාවියේ රජෙස්ටාර් ආර්. ඩී. අයි. ජයපාල මහත්මිය සහ තඹුත්තේගම බස් නැවතුම්පොළේ ස්ථාන පාලක එච්.බී.කුමාරසිංහ දිසානායක මහතා, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් ආර්.ආර්.ඒ.එස්.කේ.රත්නායක මහතා, සමාජ සේවා නිලධාරී ඒ. එම්. වසන්තා අධිකාරී මහත්මිය, පරිපාලන ග්‍රාම නිලධාරී පී. එම්. ටී. පුෂ්පකුමාර මහතා, සංවර්ධන නිලධාරී පී. ඩබ්. පී. එස්. ඩබ්. කේ. විමලසේන මහතා සහ සමෘද්ධි සංවර්ධන නිලධාරී එස්. පී. කුලරත්න මහත්මිය, වනිතා සංවර්ධන නිලධාරිනී ටී. ඕ. ඩී. ජයමහ මහත්මිය, නොච්චියාගම මහජන බැංකුවේ කළමණාකාර එච්.එම්.ඩී.හේරත් මහතා, නොච්චියාගම පොලිස් ස්ථානාධිපති එම්.එස් කුමාරසේන මහතා, නොච්චියාගම ලංකා බැංකු කළමණාකාර එස්. එම්. ආර්. ආර්. සේමසිංහ මහතා මතෙම නොච්චියාගම බස් නැවතුම්පොළේ ස්ථානහාර නිලධාරී ඕ.

ආර්. සමන් කුමාර මහතා යන මහත්ම මහත්මීන්ට අපගේ හෘදයාංගම ස්තුතිය පළ කිරීමට මයෙ අවස්ථාවක් කර ගනිමු. මමෙ අධ්‍යනයේ දත්ත හා තොරතුරු රැස්කිරීමහෙලා අනුපමේය මහෙයෙක් ඉටුකල ආර්. ඩී. එන්. එස්. ප්‍රේමරත්න මහත්මියට ද අධ්‍යනයේ මූලික වාර්තාව සැකසිම සම්බන්ධයනේ මීට දායක වූ ඉන්දික දයාරත්න මහතාට ද අධ්‍යයනයනයේ සිද්ධි අධ්‍යයන සැකසිම, විශ්ලේෂණය හා වර්තාව වැඩිදියුණු කොට අවසන් වාර්තාව සකස් කිරීම වනුවනේ කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ සහාය කථිකාචාර්ය ඉසුරු අයමේමන්ත මහතාට ද අපගේ හෘදයාංගම ස්තුතිය පිරිණමමු. දත්ත එක්රැස්කිරීම, පර්යේෂණ කණ්ඩායම සම්බන්ධීකරණය ඇතුළු අධ්‍යයනය සාර්ථකව සිදු කිරීම පිණිස අඛණ්ඩව කටයුතු කළ ආකාස සංවිධානයේ එයාපෘති නිලධාරිනී අයේෂා වදුණි ගුණසේකර ඇතුළු අනකුත් කාර්යමණ්ඩල නිලධාරීන්ට ද බහෙවේන් ස්තුති වන්ත වමෙු.

මමෙ පර්යේශණ අධ්‍යනය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා එහි ආරම්භයේ සිට උපදෙස් හා මාර්ගෝපදේශයන් මනෙම තාක්ෂණික සහයෝගය සැපයූ ආසියා පදනමේ කාන්තා හඩ හා නායකත්ව ව්‍යාපෘතියේ මනෝජා ලියනආරච්චි මනෙව්ය ඇතුළු ව්‍යාපෘති කාර්යමණ්ඩලයට ද අපගේ විශේෂ ස්තුතිය පුද කර සිටිමු.

උමේෂා අලහකෝන්

ලේකම්

ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය

සභාපතිතුමියගේ පණිවිඩය

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ පටන් අප සමාජය තුල නිතැතින්ම දක්නට ලැබුණු 'ආබාධ සහිත භාවය' මිනිස් ජීවිත බෙදනීය අයුරින් වනෙසකට හාජනය කල අතර ඒ නිසාම ඔවුන් වටා බරපතල මිත්‍යා ආකල්ප සමුදායක් නිර්මාණය විය.නුතනයේ මිනිස් ජීවිත ඉතා සුව පහසුව ගවොදැමීමට අවශ්‍ය ත්‍යායාත්මක මනෙම නාක්ෂණික දැනුමද ඉතා හොඳින් වැඩි දියුණුවී ඇති බව අප ඉතා ආඩම්බරයෙන් සිහිපත් කරමු. එහනේ නුතන විද්‍යාත්මක දියුණුවෙ ප්‍රතිපල සමස්ත සමාජයෙම ප්‍රගමණයට හේතු විය යුතු වුවත් එය මතෙකේ ප්‍රයෝගික සංකල්පයක් වී නැත.ඊට හේතු වූ කාරණා පිලිබඳ ප්‍රමාණවත් පුළුල් වූ සංවාදයක්ද සමාජය තුල ගොඩ නැගී නොමැති බව පනෙේ.

කසෙේ වතෙත් මකේ විෂමතාව උදසො මානව සන්තානගත ප්‍රතිගාමී මිත්‍යාවන් හේතුවෙන් අදටද ආබාධ සහිත පුද්ගලයන් නොසැලකිල්ලට අවමානයට හාජනය වීම දැක ගත හැකිය.මමෙ අවමන් සහගත තත්වයන් තුලින් ඔවුන් මුදවා ගනිමින් කිසියම් සමාජ සංවර්ධන කාර්යයක යදෙවීම සඳහා ජාතික වැඩ පිලිවලෙක් අවශ්‍ය වන අතර එය නුදු සුබ සාධනය පමණක් කරගත්තක් නොවිය යුතුය.

එහිලා ආබාධ සහිත පුද්ගලයන් පිලිබඳ ආබාධ සහිත භාවය පිලිබඳ නිසි විද්‍යාත්මක අධ්‍යනයන් පිලිබඳ අවධානය මීට වඩා යොමු කලයුතු බව පනෙේ.ඒ අනුව මමෙ ක්ෂෙත්‍රයේ පර්යේෂණ අවස්ථා සහ පහසුකම් වැඩි දියුණු කල යුතු අතර ඊට යම් දායකත්වයක් ලබා දීම මමෙ අධ්‍යන වාර්තාව විසින් සිදු කර ඇතැයි යන්න මාගේ අපේක්ෂාවයි.

ආබාධ සහිත භාවය කවර තරාතිරමක කවර සමාජ වටපිටාවක පුද්ගලයකුෙ වුවද පිඩාවට මනෙම නොසැලකිල්ලටත් අවමානයටත් ලක් කරයි.මමෙ තත්වය මානව දයාවනේ පිරි අපගේ වැනි ආසියාතික රටකදී වුවද නිරන්තරයනේ දක්නට ලැබේ.ඒ අන් කිසිවක් නිසා නොව ආබාධ සහිත පුද්ගලයා වටා ගොනුවී ඇති අනේක විධ මිත්‍යා ආකල්ප බව මනාව පනෙේනට තිබේ.අප ලාංකීය සංස්කෘතිය තුල වසර දහස් ගණනක් මුළුල්ලේ ආබාධ සහිත පුද්ගලයන් කරුමක්කාරයන් හෝ අවාසනාවන්තයන් සේ සලකා ඔවුන්ගේ දායකත්වය ජාතික සංවර්ධනයට සහය කර ගැනීමේ උත්සහයක්වත් නොතිබිණි.ඔවුන් දිගින් දිගටම අනුන් මත යැපනෙ පරාධිතයන් සේ සලකමින් කටයුතු කිරීමට මුළු මහත් සමාජයම පළෙඹ තිබේ.

ඒ අනුව ආබාධ සහිත පුද්ගලයන්ගේ මානව අයිතීන් පිලිබඳ වැඩි උනන්දුවක් සමාජය තුල ඉස්මතු වීමක් දක්නට නොලැබිණි.මේ හේතු මත සමාජය තුල මනෙම පරිසරය තුලද ආබාධ සහිත ප්‍රජාව පිලිගැනීමකට හෝ ගෞරවයකට ලක්වී නොතිබිණි.එහෙත් රට සංවර්ධනයේදී සලකා බැලිය යුතු තවත් ජන කණ්ඩායමක් බව අප මහෙලා සිහිපත් කරන්නේ ආබාධ සහිත වුවන් රටේ ජනගහනයනේ 10%ක තරම් ඉහල අගයක් නියෝජනය කරන නිසාය.

තීරණ ගන්නන්,සැලසුම්කරුවන් මනේම බොහෝ ආබාධ සහිත පුද්ගලයන්ද ඔවුන්ගේ අයිතිවාසිකම් මනේම සමාන අවස්ථාවන් පිලිබඳ අවධානය යොමු නොකර ඇති බැවින් ආබාධ සහිත ප්‍රජාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය වමේන් සමාජය තුල කොන්වීමට ලක්ව ඇත.පරිසරය තුලට ප්‍රවේශ වීම සඳහා ඇති බාධක ඔවුන්ට ස්වාධීන ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය අහුරා ඇත.පාරිසරික බාධා ඇතුළු බාධා ඉවත් කර සාමාන්‍ය ප්‍රජාව සඳහා නිර්බාධ පරිසරයක් ගොඩ නැගීමට සැලසුම් කරන සැලසුම්කරුවෝ සහ තීරණ ගන්නන් ආබාධ සහිත ප්‍රජාව නොසලකා හැර ඇත.එම නිසාම ආබාධ සහිත ප්‍රජාව දැඩි පීඩනයන්ට ලක්වේ.

ඉහල සංවර්ධනයන්ට ලක්වමේන්,සංචාරක පුරවරයක් බව කියන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන රාජ්‍ය ආයතන,පෞද්ගලික ආයතන,බැංකු වලෙඳ සැල්,සංචාරක හෝටල් මනේම බොහෝ ආගමික ස්ථානවලද ආබාධ සහිත ප්‍රජාව සඳහා ප්‍රවේශ පහසුකම් නොමැති බව අපගේ අත්දැකිමයි.එම නිසාම අප සංගමය මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3ක (නැගනෙහිර නුවර ගම් පළාත ,නොච්චියාගම සහ තඹුත්තේගම) රාජ්‍ය ආයතන 30 ක ප්‍රවේශ පහසුකම් පිලිබඳ සමීක්ෂණයට භාජනය කළමේ.එම ආයතන විමර්ශනාත්මක අධ්‍යනයකට ලක් කර එහි ඇති සැබෑ තත්වය මැන බැලීමට මමෙගින් අවස්ථාව ලබා ගත්තමේ.

ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආබාධ සහිත පුද්ගලයන්ගේ ප්‍රවේශ පහසුකම් පිලිබඳ කල යුත්තේ කුමක්ද යන්න අපහට සාකච්ජා කර තීරණ ගැනිමට මමේ අධ්‍යනය ඉමහත් පිටුවහලක් වනු ඇත.

එන්.පී කමලාවති

සභාපති

ආබධ සහිත කාන්තාවන්ගේ සංගමය

ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය පිළිබඳ කටේ හැඳින්වීමක්

මමෙ අධ්‍යනය දියත් කළ ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය (ආකාස) සම්බණ්ධයනේ සහ මවෙනි අධ්‍යනයක් සිදු කිරීමට එහි ඇති යෝග්‍යතාව පිළිබඳ කටේ හැඳින්වීමක් ලබාදීම මහේදි වැදගත් කොට සලකන්නමෙ.

1984 අඩු ආදුයම්ලාභී, ග්‍රාමීය පසුබිමක තරුණ ශ්‍රී ලාංකික කාන්තාවක් වන එන්.ජී. කමලාවති මනෙව්ය සිය ස්වාධීනත්වය පතා කොළඹ රැකියාවක් සඳහා තම පවුලනේ නිවසින් පිටව ගියාය. ළමා වියේදී පෝලියෝ රෝගය වැලදීම නිසා ඇයට සදාකාලික වලන ආබාධයක් ඇති විය. එමනිසා, ඇය බොහෝ බාධාවන්ට මුහුණ දුන් අතර, බොහෝ විට ඇයගේම අවස්ථාවන් නිර්මාණය කර ගැනිමට සහ විවිධ අරගලවලට මුහුණ දිමට සිදු විය. මමෙ අත්දැකීම ආබාධ සහිත පුද්ගලයන් සඳහා පොදු ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා අධිවාචනයහේ යදේමට ඇයට ස්වයං පලෙඛීමක් ඇතිවූ නමුත් ඇයගේ හුදකලා හඬින් එය සාක්ෂාත් කර ගැනිම අපහසු බව ඇයට පසක් විය.

ගැටලුවේ තිරණාත්මක බව හඳුනාගත් ඇය 1989 දි තවත් පස දනෙක්කු සමඟ එක්ව 'ශ්‍රී ලංකා ආබාධිත කාන්තා සම්මේලනය' පිහිටුවා ගත්තාය. 1995 දි කාන්තාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ බීජිං සමුලුවට සහභාගී වීමනේ පසුව සංවිධානය සහ ආබාධ සහිත කාන්තාවන් බලමුලු ගැන්වීම පිළිබඳ නව අදහස් වලින් ධෛර්යමත් වූ ඇය, 1995 දසැම්බර් 30 වන දින පැරණි සම්මේලනය ප්‍රතිසංවිධානය කරමින් ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය පිහිටුවන ලදි. ඒ වන විට එහි සාමාජිකයන් 36 ක් විය. අද වන විට ආකාස සමස්ත සාමාජිකයින් 3,200 කට අධික සංඛ්‍යාවක් සමග ව්‍යාප්ති කටයුතු මහෙයෙවූ ලබන අතර, ගමක් තුළ සාමාජිකයින්

4-8 දනෙක්‍රෙගනේ යුත් කුඩා කණ්ඩායම් වලින් ආරම්භ වන පහළ සිට ඉහළට ප්‍රවේශයක් ලසෙ සංවිධානය වී ඇත.

පටුන

ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය පිළිබඳ කටේ හැඳින්වීමක්.....4

පටුන.....5

1. හැඳින්වීම.....6

2. අධ්‍යයනයේ පසුබිම.....6

3.1 අධ්‍යයනය සඳහා නියැදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ රාජ්‍ය ආයතන තෝරා ගැනීම.....10

4. ආබාධ සහිත කාන්තාවන් සඳහා පවතින ප්‍රවේශ පහසුකම්.....3

4.1 රාජ්‍ය ආයතන කරෙහි පැවති භෞතික ප්‍රවේශය.....3

4.2 දෘෂ්‍යාබාධ සහිත කාන්තාවන් සඳහා ඇති භෞතික ප්‍රවේශය.....4

4.3 භෞතික ප්‍රවේශ ස්ථාපිත කිරීමට පවතින බාධා හා අභියෝග.....8

5. ආබාධ සහිති පුද්ගලයින්ට සේවා සැපයීමේදී රාජ්‍ය ආයතන විසින් ගනෙ ඇති ක්‍රියාමාර්ග.....9

5.1 තොරතුරු සඳහා ඇති ප්‍රවේශය..... 10

5.2 දෘෂ්‍යාබාධ සහිත පුද්ගලයින්ට තොරතුරු සඳහා ඇති ප්‍රවේශය.....11

5.3 ශ්‍රව්‍යාබාධ සහිත පුද්ගලයින්ට තොරතුරු සඳහා ඇති ප්‍රවේශය.....13

5.4 චලනාබාධ සහිත කාන්තාවන්ට සේවා සැපයීම.....14

6. කාර්යමණ්ඩල නිලධාරීන්ට ඇති ප්‍රවේශය.....16

7. තාක්ෂණික පහසුකම් කරෙහි ඇති ප්‍රවේශය.....17

8. අභියෝග සහ යෝජනා..... 18

8.1 රාජ්‍ය නිලධාරීන් සහ සේවාලාබීන් විසින් මතු කල අභියෝග.....18

8.2 අධ්‍යනය සිදු කිරීමේදී හඳුනාගත් වෙනත් අභියෝග..... 19

9. අධ්‍යයන නිර්දේශයන්..... 20

10. සාරාංශය.....21

ඇමිනුම්.....23

ඇමිනුම 1- සම්මුඛ සාකච්ඡා සඳහා යොදු ගත් ප්‍රශ්නාවලිය..... 23

ඇමිනුම 2- සිද්දි අධ්‍යනයන් සඳහා යොදු ගත් ප්‍රශ්නාවලිය.....29

1. හැඳින්වීම

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක දොළහ දරණ වගන්තියේ දක්වා ඇති පරිදි සෑම ශ්‍රී ලාංකිකයකුෙ ම සමානාත්වයේ මූලික අයිතිවාසිකමකට හිමිකම් කියයි. දොලොස්වන වගන්තියේ තවෙන සහ සිව්වන උපවගන්ති මගින් උක්ත අයිතිය වඩාත් විස්තරාත්මකව දක්වා තිබේ.

වඩාත් ශක්තිමත් නෛතික පදනමක් වශයෙන් විචාරකයන් විසින් හඳුනා නොගන්නා නමුත්, ඉහත ප්‍රතිපාදන මගින් සෑම ශ්‍රී ලාංකිකයකුටම ඇති සමානාත්මතාවයේ අයිතියත්, එම අයිතිය භුක්තිවිඳීමේදී ආබාධ සහිත පුද්ගලයන්ට මුහුණ දීමට සිදු විය හැකි බාධා ඉවත් කිරීමට රජය සතු වගකීමත් ව්‍යක්ත වේ. යථෝක්ත පසුබිම පාදක කර ගනිමින්, ශ්‍රී ලාංකිය ආබාධ සහිත ප්‍රජාව සහ ඔවුන්ගේ අයිතීන් පදනම් කර ගත් විවිධ අධ්‍යනයන් ගණනාවක් රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන විසින් සිදු කර තිබේ.

උක්ත සන්දර්භය තුල විමසා බැලීමේදී මෙම අධ්‍යනයහි අරමුණ වන්නේ රාජ්‍ය ආයතනයන් සඳහා ආබාධ සහිත කාන්තාවන්ට ඇති ප්‍රවේශය අධ්‍යනය කිරීම යි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක් මූලික කර ගනිමින් සිදු කරන ලද මෙම අධ්‍යනය මගින් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුල පිහිටි හඳුනා ගත් රාජ්‍ය ආයතනවලට භෞතික වශයෙන් ප්‍රවේශවීමට සහ, එම ආයතන මගින් සේවා

ලබා ගැනීමට පරදේශයේ ආබාධ සහිත කාන්තාවන්ට ඇති පරවේශය ඇගයීමට ලක් කරුණි. එමනේම මමෙ පරවේශය පිළිබඳ ආබාධ සහිත කාන්වන්ගේ දෘශ්‍යිකෝණය විමසිම සඳහා විවිධ ආබාධ තත්ත්වයන්ගනේ යුත් සහ සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන වතෙ පරවේශ වී ඇති කාන්තාවන් සිව් දනෙකුෙ අළලා සිදු කළ දීර්ඝ සාකච්ඡා ඔස්සේ ද මමෙ අධ්‍යයනය සඳහා තෝරතුරු ලබා ගැනිණි. මසෙේ එක් රැස් කර ගත් දත්ත විශ්ලේෂණය මගින්, එම හඳුනා ගත් ආයතනයන්ට පරවේශවීමේදී සහ සේවා ලබා ගැනීමේදී ආබාධ සහිත කාන්තාවන්ට මුහුණදීමට සිදු විය හැකි අහියෝගයන් සහ, එම අහියෝගයන් මගහරවා ගත හැකි ආකාරයන් පිළිබඳ විග්‍රහයක නිරතවීමට මමෙ අධ්‍යයන වාර්තාව උත්සාහ දරයි.

2. අධ්‍යයනයේ පසුබිම

ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ගෝලීය සාකච්ඡා වඩාත් කේන්ද්‍රගත අවධානයක් දිනා ගන්නේ 1980 දශකය පමණ සිටය. මහිලා බලපෑ මූලික සාධකයක් නම් 1980 දශකය වනවිට ආබාධිතභාවය සම්බන්ධ ගෝලීය නිර්වචනයන්ගේ සිදුවූ වනෙස්වීමයි. එනම්, ආබාධිතභාවය පුද්ගල ශාරීරික හෝ මානසික දුබලතාවයක් ලසෙට අර්ථකතනය කල වෛද්‍ය විද්‍යාත්මක දෘෂ්ටිකෝණයන් ප්‍රතික්ෂේප කල ගෝලීය සමාජය, එය අපගේ සමස්ථ සමාජ, දේශපාලන සහ ආර්ථික ක්‍රමවේදයන්ගේ දුබලතා සහිත පුද්ගලයන් පිලිගැනීමට ඇති නොහැකියාවේ හෝ මැලිකමහේ ප්‍රතිඵලයක් ලසෙට අර්තකතනය කිරීමට පලෙඹුනහ. ආබාධිතතාවය අර්ථකතනය කිරීම සම්බන්ධයනේ සිදුවූ මමෙ විප්ලවීය වනෙසහේ වැදගත් ප්‍රතිඵලයක් වූයේ ලෝක සමාජයා සිය සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික ක්‍රියාකාරකම් සහ පිළිවතේ සම්බන්ධයනේ ස්වයං-විවේචනයකට යොමුවීමත්, ඒ ඔස්සේ එම ක්‍රියාකාරකම් සහ පිළිවතේ ආබාධ සහිත පුද්ගලයින්ගේ සහභාගීත්වයට ඉඩ සැලසනෙ පරිදි ප්‍රතිවිශ්ලේෂණය කිරීමත් ය. එනම්, ඉහත සඳහන් කල වනෙස්කම්හි ප්‍රතිඵලයක් වශයනේ ආබාධ සහිත පුද්ගලයන්ගේ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳව ප්‍රථමවරට ගෝලීය කතිකාවතකට මුලපිරිණි. මේ ආකාරයට ප්‍රවලිතවූ ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ගෝලීය කතිකාවත ප්‍රතිපත්ති සම්පාදනය හරහා විද්‍යමානවූ ප්‍රමුඛ අවස්ථාවක් වන්නේ එක්සත් ජාතීන් විසින් 1981 වසර ආබාධ සහිත පුද්ගලයින්ගේ වසර ලසෙ නම් කිරීමත්, එම වසරහේ මූලික අරමුණක් වශයනේ අවස්ථා සමාන කිරීම හඳුනා ගැනීමත්ය. තවදුරටත්, එක්සත් ජාතීන්ගේ ආබාධ සහිත පුද්ගලයන්ගේ දශකය (1983-1992) සහ එක්සත් ජාතීන්ගේ ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (2007) වැනි ගෝලීය සන්ධිස්ථානයන්ට ළඟාවීම ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂණයේහීලා ලෝකයා ලැබූ ජයග්‍රහනයන් වශයනේ සඳහන් කල හැකි වේ.

ශ්‍රී ලාංකිය ආබාධ සහිත ප්‍රජාවේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහාවූ නෛතික රාමුවේ මූලික පියවරක් ලසෙ 1996 අංක 28 දරණ ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත දැක්විය හැකිය. උක්ත පනතහේ දක්වා ඇති පරිදි ආබාධිත තැනැත්තකුෙ යනු, *"තම ශාරීරික හෝ මානසික හැකියාවන්හි උපතින්ම හෝ පසුකාලීනව ඇතිවූ යම් ඌනතාවයක ප්‍රතිඵලයක් වශයනේ, තම ජීවන අවශ්‍යතා සම්පූර්ණයනේ හෝ අර්ධ වශයනේ සහතික කර ගැනීමට තමා විසින්ම නොහැකි වන ඕනෑම අයකුෙ*". මමෙ නිර්වචනය ආබාධිතභාවය පිළිබඳ වෛද්‍ය සහ සමාජ-ආර්ථික යන දෘෙංශයේම ඇතුළත් සාධාරණ සහ පුළුල් නිර්වචනවලින් එකකි. උක්ත අර්ථකතනයේ ප්‍රතිඵලයක් වූයේ ශ්‍රී ලංකා සමාජය තුල

ආබාධ සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතා සම්බන්ධ කතිකාවතක් පමණක් නොව, ඔවුන්ගේ අයිතිවාසිකම් ඉලක්ක කර ගත් නීතිමය රාමුවක්ද ස්ථාපනයවීමට ඉඩ සැලසීමයි.

ආබාධ සහිත ශ්‍රී ලාංකිකයින්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඉතා වැදගත්ම සන්ධිස්ථානය වන්නේ 2003 වසරහි ඉදිරිපත්වූ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියයි. සමාජ සුබසාධන අමාත්‍යංශයහි මූලිකත්වයෙන් හඳුන්වාදුන් උක්ත ප්‍රතිපත්තිය මගින් ආබාධ සහිත පුද්ගලයින්ට හිමි විය යුතු අයිතිවාසිකම් ගණනාවක් ම හඳුන්වාදෙන ලදී. මේ ආකාරයෙන් අවධාරණය කරුණු ප්‍රමුඛ අයිතිවාසිකමක් නම් යටිතල පහසුකම් කරෙහි ප්‍රවේශවීමට ඔවුන්ට ඇති අයිතියයි. එහි අංක 12 දරණ කොටසෙහි දක්වා ඇති පරිදි, “ආබාධ සහිත පුද්ගලයින්ට, සිය ගමනාගමනයට සහ වෙනත් සේවාවන් ලබා ගැනීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීමේදී බාධක රහිතව පොදු ගොඩනැගිලි, පොදු මාර්ග, උද්‍යාන, විවේකාගාර, සෝපාන සහ පඩිපෙළ වෙත ප්‍රවේශවීමේ හැකියාව තහවුරු කිරීම වැදගත් කොට ගැනේ. එම ප්‍රතිපත්තිය මගින් තව දුරටත් දක්වන්නේ සමාජ සුබසාධන අමාත්‍යංශය විසින් සකස් කරන ලද ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රවේශ වීමේ හැකියාව පිළිබඳ රගෙලාසිවලට අනුකූලව යටිතල පහසුකම් සකස් කිරීමට සෑම ආයතනයකටම වගකීමක් ඇති බවයි. ප්‍රවේශ පහසුකම් තහවුරු කිරීම සම්බන්ධයෙන් ලක් රජයේ වගකීම යලින් අවධාරණයවූ අවස්ථාවක් වූයේ 2007 වසරේදී ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අත්සන් තබා එය පිළිගැනීමයි. මෙම ප්‍රඥප්තියේ නවවන වගන්තිය මගින් සාමාජික රාජ්‍යන්ට ආබාධ සහිත පුද්ගලයින්ට සාධාරණවූ ප්‍රවේශ පහසුකම් ලබාදීමට ඇති වගකීම අවධාරණය කරයි.

උක්ත පදනම් මත පිහිටා රාජ්‍ය ආයතනයන් විවිධ අවස්ථාවලදී ආබාධ සහිත පුද්ගලයින්හට ප්‍රවේශ පහසුකම් සැපයීම සම්බන්ධ රගෙලාසි හඳුන්වාදී තිබේ. මෙහෙලා වැදගත් වන මූලිකම පියවරක් වනුයේ 2006 වසරේ අංක 1 දරන ආබාධ සහිත පුද්ගලයින් සඳහාවූ ප්‍රවේශතා රගෙලාසීන් ය. 1996 අංක 28 දරන ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනතේ අංක 25 සහ 23 යන වගන්ති මගින් ලබාදී තිබූ ප්‍රතිපාදන පදනම් කර ගනිමින් අංක 1,467/15 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් උක්ත රගෙලාසීන් ප්‍රකාශයට පත් කරන ලදී. එහි දවෙන සහ තවෙන වගන්ති මගින් මෙසේ දක්වා තිබේ.

2. (1) මෙම රගෙලාසි වල විධිවිධාන සියලුම පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන සහ පොදු සේවාවන් ලබා ගත හැකි ස්ථාන සඳහා, ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රවේශය ඇති ගොඩනැගිලි, ස්ථාන සහ සේවාවන් සඳහා අදාළ වේ.

3. (1) කිසිඳු තැනැත්තකු කිසිදු පොදු ස්ථානයක පොදු ගොඩනැගිල්ලක් හෝ වියුහයක් ඉදි කිරීම හෝ ඕනෑම පොදු ස්ථානයක ඇති මොනයම් හෝ පොදු ගොඩනැගිල්ලක් හෝ වියුහයක් නැවත ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීමේදී එවැනි ගොඩනැගිල්ලකට හෝ වියුහයකට අදාළ කිසියම් සැලැස්මක්

(A) මෙම රගෙලාසිවල I උපලේඛනයේ I කොටසෙහි දක්වා ඇති කාර්ය සාධන පිරිවිතරයන් වෙත සහ

(B) මෙම රගෙලාසි වලට I උපලේඛනයේ II කොටසෙහි දක්වා ඇති සැලසුම් වලට අනුකූල නොවේ නම් එවැනි ඉදිකිරීම් සිදු නොකළ යුතු වේ.

ඉහත 2 (1) දරන වගන්තියට අනුව තව දුරටත් මමෙ ගැසට් පත්‍රය මගින් නිර්දේශ කරන ලද්දේ "දැනට පවතින සියලුම පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන සහ පොදු සේවාවන් පවතින ස්ථාන, මමෙ රගෙුලාසි ක්‍රියාත්මක වීමේ සිට වසර තුනක කාලයක් ඇතුළත, මමෙ රගෙුලාසිවල විධිවිධානවලට අනුකූලව ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රවේශ විය හැකි පරිදි සකස් කළ යුතු" බවයි. මීට වසර කිහිපයක් ඇවෑමෙන් 2013 වසරේදී සෞඛ්‍ය අමාත්‍යංශය විසින් ගොඩනැගිලි සැලසුම් නිර්මාණය කිරීමේදී සැලකිය යුතු, ආබාධ සහිත පුද්ගලයින්ගේ ප්‍රවේශ අවශ්‍යතා සම්බන්ධ උපදෙස් මාලාවක් හඳුන්වා දෙන ලදී. උක්ත චාර්ථාව මගින් මූලික වශයෙන් දක්වා ඇත්තේ ආබාධ සහිත පුද්ගලයින්ට ඇති ප්‍රවේශ පහසුකම් තහවුරු කිරීමේදී වඩාත් වැදගත් වන්නේ එම අවශ්‍යතාවය ඇති එක් එක් අවස්ථාවන් හඳුනා ගැනීමත්, ඒ එක් එක් අවස්ථාවන්ට උචිත වන අනන්‍යවූ විසඳුම් හඳුනා ගැනීමත් බවයි.

ආබාධ සහිත පුද්ගලයින්ට පොදු ස්ථාන කරෙහි ඇති ප්‍රවේශ පහසුකම් තහවුරු කිරීම සම්බන්ධයෙන්වූ ඉතා වැදගත් නඩු තීන්දු ද්විත්වයක් ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මේ වන විට ප්‍රකාශයට පත් කර තිබේ. මෙහි ප්‍රථම නඩු තීන්දුව ප්‍රකාශයට පත් වන්නේ 2011 වසරේදී ය. ඒ වෛද්‍ය අජිත් පරේරා සහ ඉදිරිය නම්වූ සමාජ ක්‍රියාකාරී කණ්ඩායම විසින් ප්‍රවේශ්‍ය අවශ්‍යතා සම්බන්ධ මරෙට ස්ථාපිත රගෙුලාසි ක්‍රියාත්මක කිරීමට නියෝගයක් ඉල්ලා ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සමත් සමගය. පෙත්සම්කරුවන් තර්ක කරන ලද්දේ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 23 වැනි වගන්තිය සහ 2006 අංක 1 දරණ ආබාධිත පුද්ගලයන්ගේ ප්‍රවේශවීමේ අයිතිවාසිකම් සම්බන්ධ රගෙුලාසි යටතේ එම තැනැත්තන්ට හිමි විය යුතු ප්‍රවේශ පහසුකම් නෛතිකමය වශයෙන් සහතික කර තිබෙන නමුත්, අලුතින් ඉදිකරෙන ගොඩනැගිලිවල පවා මමෙ පහසුකම් නොසලකා හැර ඇති බවයි. උක්ත පෙත්සම සම්බන්ධයෙන් තම ඒකමතික තීන්දුව ලබා දමමින් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේ *"කිසිදු පුද්ගලයකු තම ආබාධිතතාවය හේතු කොට ගනෙ පොදු ගොඩනැගිලිවලට සාධාරණ හෛතික ප්‍රවේශයක්"* ලබා ගැනීමේදී යම් වනෙස්කමකට හෝ අසාධාරණයකට ලක් නොවිය යුතු බවයි. අලුතින් ඉදි කරන්නාවූ ගොඩනැගිලි 2006 අංක 60 දරන ප්‍රවේශ පහසුකම් සම්බන්ධවූ රගෙුලාසිවලට අනුකූල විය යුතු බව දැක්වූ අධිකරණය, මමෙ නියෝගය කඩ කරන ගොඩනැගිලි සම්බන්ධයෙන් සැලසුම් අනුමත කිරීමනේ හෝ අනුකූලතා සහතික නිකුත් කිරීමනේ සියලු බලධාරීන් වැලකිය යුතු බවට වැඩිදුරටත් නියෝග කරන ලදී. මමෙ අධිකරණ තීන්දුව මගින් තැබූ වඩාත් ප්‍රගතිශීලී පියවරක් වූයේ උක්ත නියෝගයන් කඩවන අවස්ථාවක් සම්බන්ධයෙන් අධිකරණයට මෝසමක් ගනෙ ඒමට පුරවැසියන්ට ඇති අයිතිය පුනර්වාචනය වීමයි. එසේ වුවත්, ඉහත නඩු තීන්දුවේ මූලික වගවීම පැවතියේ අලුතින් ඉදි කරෙනෙ ගොඩනැගිලි සඳහා පමණි. උක්ත ප්‍රතිපාදනයන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2013 වසරේදී ලබාදුන් තම දවෙන නඩු තීන්දුව මගින් වඩාත් පුළුල් කරෙනුයේ, ප්‍රතිසංස්කරණයට ලක් කරන දැනට වැඩ නිමවා ඇති පැරණි ගොඩනැගිලිද එහි ප්‍රස්තුතයට අයත් කරමිනි.

මමෙ වාර්ථාවහි අරමුණ අවබෝධ කර ගැනීමේදී ඉහත නෛතික පදනම වැදගත් වේ. විශේෂයෙන්ම, ඉහත විග්‍රහය මගින් තහවුරු වන්නේ ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රවේශ පහසුකම් ලැබීමට ඇති අයිතිය වඩාත් පැහැදිලිව හඳුනා ගනෙ ඇති බවයි. එනමුත් මහිලා වැදගත් ලසෙ මමෙ වාර්ථාව මගින් සැලකිල්ලට ගැනනෙ අරමුණු කිහිපයක් ඇත. එහි ප්‍රාථමික අරමුණ නම්

අල්පතරයක්වූ ආබාධ සහිත පුද්ගලයින්ගේ පරවේශ පහසුකම් සම්බන්ධ සිද්ධි අධ්‍යයනය පෝෂණය කිරීමට දායක වීමයි. ඉහතින් පැහැදිලි කල ආකාරයට ආබාධ සහිත පුද්ගලයින්ගේ පරවේශ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන කතිකාවත දශක කිහිපයක් ඔස්සේ ගොඩනැගී ඇති බව පැහැදිලි වන නමුත්, ප්‍රායෝගික පදනමක පිහිටා එම පහසුකම් කොතෙකුත් දුරට ආබාධ සහිත පුද්ගලයන්ට රාජ්‍ය හෝ පුද්ගලික ආයතනයන් මගින් සපයන්නේද යන්න අධ්‍යනය කරන සිද්ධි අධ්‍යනයන්ගේ පැහැදිලි අඩුවක් දක්නට තිබේ.

එම අඩුව පිරවීමට දායකවීම මහේ මූලිකම අරමුණයි. මහි දවෙන අරමුණ වන්නේ වඩාත් පුළුල් පසුබිමක පිහිටා පරවේශ පහසුකම් අර්ථ දැක්වීමයි. බහුතරයක්වූ පරවේශ පහසුකම් සම්බන්ධ ශ්‍රී ලාංකීය සිද්දි අධ්‍යනයන් බොහෝ විට “පරවේශය“ යන සංකල්පය එතරම් පුළුල් කෝණයක සිට නිර්වචනය කර ඇති බවක් දක්නට නොලැබේ. මතෙකේ දක්නට ලැබුනු බොහෝ අධ්‍යනයන්ට වඩා පියවරක් ඉදිරියට යමින් මමෙ අධ්‍යනය පරවේශය යන්න යටතල පහසුකම් කරෙහි ඇති භෞතික පරවේශය ඉක්මවා යන්නක් බව අවධාරණය කරයි. එනම් මමෙ අධ්‍යනය මගින් එම හඳුනා ගත් රාජ්‍ය ආයතන ලබා දනෙ සේවාවන්, තොරතුරු සහ මානව සම්පත ආදි කොට ගත්, පරවේශ පහසුකම් අධ්‍යනයේදී වඩාත් අවධානයට නොගැනෙන අංශ කරෙහිද අවධානය යොමු කරමින්, වඩාත් පුළුල් පරාසයක විහිදි ගිය අවබෝධයක් ලබාදිමට වෑයම් දරයි.

එමනේම ආබාධ සහිත ප්‍රජාව තුළද කාන්තවක් වීම නිසාම තව දුරටත් ආනතීකරණයට ලක්වන ආබාධ සහිත කාන්තාවන්ගේ දෘෂ්ටිකෝණයකින් පරවේශය දසෙ බැලිමේ අවශ්‍යතාවය ද මමෙ අධ්‍යයනය තුලින් ඉස්මතු කිරීමට උත්සාහ දරයි. විවිධ පුද්ගල අනන්‍යතාවන් සලකා බලන විට කාන්තාවන් වීම නිසාම ස්ත්‍රීපුරුෂ සමාජභාවීය අනන්‍යතාව හේතුවෙන් සිදු වන නොසලකා හැරීම් මනේම ආබාධිතබව යන අනන්‍යතාව ද ඊට එක්වූ විට ආබාධ සහිත කාන්තාවන් ආන්තීකරණයට ලක්වීමට ඇති හැකි හැකියාව වඩාත් තීව්‍ර වේ. එබැවින් කාන්තාවන්ගේ අයිතින් සුරක්ෂිත කිරීම සඳහා කැපවූ සංවිධානයක් ලසෙ ආකාස සංවිධානය මමෙ අධ්‍යයනය කාන්තාවන්ගේ දෘෂ්ඨිකෝණයකින් පරවේශය පිළිබඳ දැකීමට උත්සාහ කරයි.

එබවින් මමෙ අධ්‍යනය උක්ත විෂය මූලික කර ගත් අනාගත අධ්‍යනයන් කරෙහි නිදර්ශකයක්ද වනු ඇත. තවෙනුව, මමෙ අධ්‍යනය යථෝක්ත විෂය මූලබිජය කර ගත් තවත් අධ්‍යනයන් සිදු කිරීමේ ඇති වැදගත්කමද අවධාරණය කිරීමට අරමුණු කරයි. මන්දයත්, වර්තමානයේ මරෙට ස්ථාපිත ආබාධ සහිත පුද්ගලයින්ට පරවේශ පහසුකම් සැපයීම ආශ්‍රය කර ගත් නෛතික රාමුවනේ ප්‍රතිඵල ලබා ගැනීමහෙලා ශ්‍රී ලාංකීය සමාජය තුළ එම පහසුකම් සැපයීම සම්බන්ධව වන යථා රූපය අවබෝධ කර ගැනීම වැදගත් වන හයෙනි. ඉහත අරමුණු සපුරා ගැනීමේදී මමෙ වාර්ථාව පහත අනුඅරමුණු ඉටු කර ගැනීම කරෙහිද අවධානය යොමු කරයි.

1. විවිධ ආබාධ සහිත කාන්තාවන්ට වනෙත් සහායකයකුගේ ආධාරයකින් තොරව තෝරා ගත් රාජ්‍ය ආයතන වතෙ භෞතික වශයනේ පරවේශවීමට ඇති හැකියාව හඳුනා ගැනීම

2. විවිධ ආබාධ සහිත කාන්තාවන්ට එම ආයතන විසින් සපයන සේවා වතෙ පරවේශවීමට ඇති හැකියාව හඳුනා ගැනීම

3. විවිධ ආබාධ සහිත කාන්තාවන් මමෙ රාජය ආයතනවලට පිරවෙිශවීමේදී සහ සේවා ලබාගැනිමේදී අත්දුටු අත්දැකීම් හා ගැටලු හඳුනාගැනිම

3. අධ්‍යයන ක්‍රමවේදය

මමෙ අධ්‍යනයේ දත්ත එක් රැස් කිරීම සඳහා මූලික වශයනේ පිරශ්නාවලි ක්‍රමය සහ සිද්දි අධ්‍යනයන් යොදු ගන්නා ලදී. තව දුරටත්, පිරශ්නාවලි ක්‍රමය භාවිතයට ගනිමින් දත්ත එක් රැස් කිරීමේදී මූලික ක්‍රමවේද දෙකෙක් අනුගමනය කරන ලදී.

1. සාකච්ජාව මගින් තොරතුරු රැස් කිරීම- මහෙදි තෝරා ගත් රාජය ආයතනයන්හී රාජය නිලධාරීන් සමග සාකච්ජාවන් මහෙයෙවන ලදී. මමෙ සාකාච්ජාවන් හරහා යථෝප්ථ ආයතන මගින් ආබාධ සහිත කාන්තාවන්ට ලබා දනෙ සේවාවන්, එලසෙ සේවා ලබාදිමේදී තෝරාගත් නිලධාරීන් ලබාගත් අත්දැකීම්, ඔවුන් මුහුණ දුන් අභියෝග ආදී කරුණු කරෙහි අවධානය යොමු කරන ලදී.

2. නිරීක්ෂණය මගින් තොරතුරු රැස් කිරීම- රාගත් රාජය ආයතනයන්ගේ පොදු ස්ථාන, එනම් රථගාල, සේවා සැපයනෙ කව්ළු, වැසිකිලි ආදී ස්ථාන කරෙහි ආබාධ සහිත පුද්ගලයින්ට ඇති පිරවෙිශය අධ්‍යනය කරන ලදී.

මලෙසෙ එක් රැස් කර ගත් දත්ත වඩාත් පුළුල් ලසෙ අවබෝධ කර ගනු වස්, උක්ත ආයතන මගින් සේවා ලබා ගත් ආබාධ සහිත කාන්තාවන්ගෙ අත්දැකීම් ද මමෙ වාර්ථාවට අන්තර්ගත කර ගන්නා ලදී. එමගින් ආබාධ සහිත කාන්තාවන්ගෙ දෘෂ්ඨිකෝණයකින් පිරවෙිශය දසෙ බැලීමට උත්සාහ ගැනිණි. සිද්දි අධ්‍යන ක්‍රමවේදයක් භාවිතා කරමින්, එලසෙ සේවා ලබා ගත් කාන්තාවන් 6 දනෙක්ුගෙ අත්දැකීම් එක් රැස් කර ගන්නා ලදී.

3.1 අධ්‍යයනය සඳහා නියැදි පිරාදෙශීය ලෙකම් කොට්ඨාස සහ රාජය ආයතන තෝරා ගැනීම

අනුරාධපුර දිස්තරික්කයේ පිරාදෙශීය ලෙකම් කොට්ඨාස 23 ඇති අතර ඉන් පිරාදෙශීය ලෙකම් කොට්ඨාස තුනක් පමණක් තෝරා ගැනිණි. එසේ තෝරා ගත් පිරාදෙශීය ලෙකම් කොට්ඨාස අතරට

1. නැගනෙහිර තුවර ගම්පලාත (අනුරාධපුර නගර කලාපය)
2. තඹුත්තෙගම
3. නොච්චියාගම

අයත් වේ.


ඉහත පිරාදෙශීය ලෙකම් කොට්ඨාස තෝරා ගැනීමට මූලිකවූ නිර්නායක පහත දැක්වේ.
:

- අනුරාධපුර නගරය ඇතුලත් වීම - අනුරාධපුර නගරය නැගනෙහිර තුවර ගම්පලාත ට අයත්වේ. රාජය සේවාවන් සැපයනෙ පිරධාන ආයතන මහෙි පිහිටා ඇත.

- ප්‍රාදේශීය වශයෙන් ප්‍රධාන නගර වීම
- ආකාස ආයතනයට සමීප වීම

මෙේ තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුල රාජ්‍ය සේවා සපයන ආයතන රාශියක් ඇති බැවින් ඉන් ප්‍රධාන ආයතන දහයත් දොලහත් අතර සංඛ්‍යාවක් පමණක් ඒ ඒ කොට්ඨාසයෙන් තෝරා ගැනුණි. අධ්‍යයනය දියත් කිරීමේ පවතින ප්‍රායෝගිකත්වය, සීමාවන් සහ ආබාධ සහිත කාන්තාවන්ට වඩාත් සමීප/ අත්‍යවශ්‍ය සේවා ලබා දෙන ආයතන වීම ආදී කරුණු පදනම් කර ගනෙ මමෙ ආයතන තෝරා ගැනුණි. මහි සඳහන් ඇතැම් ආයතනවලට එක් නිලධාරියකුෙ සමග සාකච්ඡා කිරීම සහ එක ප්‍රශ්නාවලියක් පිරවීම ප්‍රමාණවත් වුවද ඇතැම් ආයතනයන්හි නිලධාරීන් කිහිපදනෙකුෙ සමග සාකච්ඡා කිරීමට සහ වනෙ වනෙම ප්‍රශ්නාවලි පිරවීමට සිදු විය. මේ අනුව සමස්ත අධ්‍යයනයට ඉහත සඳහන් කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුන තුළ රාජ්‍ය ආයතන 21ක් යොදු ගත් අතර ඒ ඒ විෂය පතයට අදාළ රාජ්‍ය නිලධාරීන් 35 දනෙකුෙ සමග සම්මුඛ සාකච්ඡා හරහා ප්‍රශ්නාවලි සම්ක්ෂණය සිදු කරෙණි. පහතින් දක්වා ඇත්තේ එසේ තෝරා ගත් රාජ්‍ය ආයතනයන් සහ ඒ එක් එක් ආයතනයට අදාල වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සම්බන්ධ දළ සටහනකි.

රූපසටහන **1-** අධ්‍යයන සඳහා යෙොදු ගත් රාජ්‍ය **ආයතන** සහ රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමනේ




අධ්‍යයනය සඳහා යොදුගත් රාජ්‍ය ආයතන සහ සේවා අංශ පහත දැක්වේ.

1. බස් නැවතුම්පොළ - නොවේරියාගම
2. පොලිස් ස්ථානය - නොවේරියාගම
3. ලංකා බැංකුව - නොවේරියාගම
4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නොවේරියාගම
5. මහජන බැංකුව- නොවේරියාගම
6. බස් නැවතුම්පොළ - තඹුත්තෙගම

7. මහේස්ත්‍රාත් උසාවිය- තඹුත්තේගම
8. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - තඹුත්තේගම
9. මහජන බැංකුව -තඹුත්තේගම
10. පොලිස් ස්ථානය- තඹුත්තේගම
11. මූලික රෝහල- තඹුත්තේගම (රෝහල් අධ්‍යක්ෂක)
    බාහිර රෝගි අංශය - තඹුත්තේගම
    නේවාසික රෝගි අංශය- තඹුත්තේගම
    සායනික අංශය - තඹුත්තේගම
    ප්‍රසව ඒකකය -තඹුත්තේගම
    හදිසි ප්‍රතිකාර ඒකකය - තඹුත්තේගම
12. මහජන බැංකුව- අනුරාධපුර (නැ.නු.ප)
13. මානව හිමිකම් කොමිෂන් සභාව- අනුරාධපුර
14. නගර සභාව (නැ.නු.ප)
15. මහ නගර සභා පුස්තකාලය
16. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (නැ.නු.ප)
17. පොලිස් ස්ථානය- අනුරාධපුර (නැ.නු.ප)
18. කාන්තා හා ළමා කාර්යාංශය - අනුරාධපුර (නැ.නු.ප)
19. උසාවි සංකීර්ණය - අනුරාධපුර (නැ.නු.ප)
20. මධ්‍යම බස් නැවතුම්පළ
21. ප්‍රා.ලේ.කාර්යාලය -නැ.නු.

අධ්‍යයනයේදී අවධානය ආයතනයේ භෞතික පරවේශය මතේම සේවා පරවේශය ද සලකා බැලනෙ බැවින් ඒ ඒ ආයතනය මගින් ලබා දෙන සේවා වනෙ වනෙම සලකා බලන ලදි. මේ අනුව එක් ආයතනයකින් සේවා කිහිපයක් සැලසනෙ අවස්ථාවන් හිදී ඒ ඒ සේවාවට අදාළ රාජ්‍ය නිලධාරීන් වනෙ වනෙම සාකච්ඡා පැවැතිවිණි. මසෙේ එක් රාජ්‍ය ආයතනයක් තුළ රාජ්‍ය නිලධාරීන් කිහිපදනෙකු සමග සාකච්ඡා පැවැත්වූයේ දිස්ත්‍රික් හා පරදේශීය ලේකම් කාර්යාල සහ පොලිස්ය යන ස්ථානයන්හිය.


සේවා ස්වභාවය අනුව සැලකා බැලුණු සේවා පහත දැක්වේ.



මීට අමතරව, සේවා ස්ථාන නිරීක්ෂණය කිරීමේදී එක් **ආයතනයක්** තුළ විවිධ ස්ථාන නිරීක්ෂණයට ලක් වුණි. මේ සඳහා නිදසුනක් ලසෙ මූලික රෝහල් පරිශ්‍රය දැක්විය හැකිය. **ඒ**

ඒ රාජ්‍ය **ආයතනය** තුළ සේවා කවුලු නිරීක්ෂණය කිරීම, සේවා ස්ථානයේ ස්වභාවය, අදාළ රාජ්‍ය නිලධාරීන්ගේ කාලය සහ **ඒ** සඳහා **ඇති** ඉඩකඩ අනුව වෙනස්වේ.





පහත වගුව මගින් මමෙ අධ්‍යනය සඳහා අධ්‍යනය කරන ලද ආබාධ සහිත කාන්තාවන් සම්බධයෙන් සාරාංශගත විස්තරයකි. ඔවුන් වයස අවුරුදු 24ත් 56ත් අතර පරාසයක් නියෝජනය කරන අතර, රාජ්‍ය ආයතන එකකින් හෝ කිහිපයකින් සේවා ලබා ගනෙ තිබෙ. එලෙස අධ්‍යනයට සහභාගිවූ කාන්තාවන්ගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීමටත්, දත්ත පිලිගැන්වීමේ පහසුව තකාත්, ඔවුන් හැඳින්වීම සඳහා අන්වර්තනාමයන් භාවිතා කර ඇති බව මහිදි සඳහන් කල යුතුවෙ.

වගු අංක 1- සිද්ධි අධ්‍යනය සඳහා සහභාගිවූවන්

	නම	වයස	ආභාධිතතාව	සේවා ලබාගත් රාජ්‍ය ආයතන
1	අනුලා		ජානමය අස්ති රෝගයක් නිසා ඇතිවූ කෘෂබව	●ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ●පාසල ●මහජන, ලංකා, සනස සහ ආර්.ඩී.බී. බැංකු ශාඛා
2	විමලා	53	පෝලියෝ තත්වය නිසා දකුණු පාදයේ ඇතිවූ ආභාධයක්	●ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ●බැංකු ශාඛා
3	සුසිලා	24	එක් අතක් පණ නැති වීම	●ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
4	පද්මා	25	එක් පාදයක් කොටවීම	●ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ●සමෘද්ධි බැංකුව ●රෝහල
5	අකිලා	35	දෘෂ්‍යාබාධිත	●රෝහල

6	තක්ෂිලා	56	ඇවිදීමට තොහැක	●සමෘද්ධි බැංකුව

මමෙ අධ්‍යයනය නියමු අධ්‍යයනයක් වීම, අධ්‍යයන කාලය සහ අයවැය යන කරුණු පදනම් කර ගනිමින් ඉහත අධ්‍යන රාමුව සකස් කරන ලදී.

4. ආබාධ සහිත කාන්තාවන් සඳහා පවතින පරිසර පහසුකම්

මමෙ පරිච්ඡේදයේ අරමුණ වන්නේ අධ්‍යනය මගින් පරීක්ෂාවට ලක් කරන ලද රාජ්‍ය ආයතනයන්හී පරිසර පහසුකම් සම්බන්ධයෙන් විග්‍රහයක නිරත වීමයි. පෙර සඳහන් කළ පරිදි මමෙ අධ්‍යයනයේ පරිසරය යන්නෙන් භෞතික වශයෙන් යම් පරිශ්‍රයකට පරිසරවීමට ඇති හැකියාව සහ එම ආයතනය විසින් ලබා දෙන සේවා ලබා ගැනීමට ඇති හැකියාව යන කරුණු දෙකෙම සලකා බැලේ. මමෙ අධ්‍යයනය විසින් සලබා බැලුනෙ චලනාබාධ, දෘෂ්‍යාබාධ සහ ශ්‍රව්‍යාබාධ යන ආබාධ වර්ග තිරිත්වයෙන් භෞතික පරිසරය පිළිබඳ ගැටලු පැන නැගෙනෙ චලනාබාධ, දෘෂ්‍යාබාධ සහිත පුද්ගලයින්ට හෝ කාන්තාවන්ට පමණි. එබැවින් ඉදිරියේ සඳහන් භෞතික පරිසරය පිළිබඳ සාකච්ඡාවේදී එම කණ්ඩායම් දෙක පිළිබඳ අවධානය යොමු කරන අතර සේවා සඳහා ඇති පරිසරය කොටස මගින් ආබධ තිරිත්වය පිළිබඳ ව ම විග්‍රහයක යෙදෙනු ඇත.

4.1 රාජ්‍ය ආයතන කරෙහි පැවති භෞතික පරිසරය

සේවා ලබා දෙන ආයතන වෙත පවතින භෞතික පරිසරය ආබාධ සහිත පුද්ගලයින්ට එම ආයතන හරහා සේවා ලබා ගැනීමේදී කේන්ද්‍රීය වැදගත්කමක් උසුලයි. ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නවවන වගන්තියේ දක්වා ඇති පරිදි සාධාරණ පරිසරය මගින් අපේක්ෂා කරන්නේ සෑම ආබාධ සහිත පුද්ගලයෙකුටම ස්වාධීනව ජීවත්වීමට සහ එදිනෙදා ජීවිතයේ කටයුතු සඳහා පූර්ණ වශයෙන් සහභාගීවීමට ඔවුන්ට ඇති අයිතිය තහවුරු කිරීමයි (ඒක්සත් ජාතීන්ගේ සංවිධානය, 2008). උක්ත අරමුණ වෙත ගමන් කිරීමේදී මහජනතාවට සේවා සපයන රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වෙත පවතින භෞතික පරිසරය මූලික වැදගත්කමක් උසුලයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වන පරිදි මමෙ භෞතික පරිසරය යන්න පහත ආකාරයෙන් අවබෝධ කර ගත හැකි වේ.

“භෞතික පරිසරස්‍යතාව යනු පුද්ගලයෙකුට සිය වෘත්තිය, ක්‍රීඩා, අධ්‍යාපන, ව්‍යාපාර, සේවා ආදී අවශ්‍යතා සඳහා යාමට අවශ්‍ය විය හැකි ගොඩනැගිලි, පොදු අවකාශයන් සහ වෙනත් ඕනෑම ස්ථානයකට පරිසරවීමට හැකි පරමාණයයි. භෞතික පරිසරයට පරිසර විය හැකි මාර්ග, බැවුම් මාර්ග, වාහන නැවැත්වීමේ සහ මගින් පැටවීමේ කලාප, සෝපාන, සංඥා, ගොඩනැගිලි පිවිසුම් සහ විවේකාගාර නවාතැන් ආදිය ඇතුලත් වේ”.

මේ ආකාරයට සලකන විට පුද්ගලයෙකුට තම එදිනෙදා ජීවිතය පවත්වා ගනෙ යාමේදී මතු වන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පිවිසිය යුතු රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන

කරෙහි ප්‍රවේශවීමට ඇති හැකියාව උක්ත භෞතික ප්‍රවේශය මගින් අධ්‍යනය කරනු ලැබේ. උක්ත අවබෝධය මූලික කර ගනිමින් මමෙ වාර්තාව ඒ එක් එක් තෝරා ගත් රාජ්‍ය ආයතන කරෙහි විවිධ ආබාධ සහිත පුද්ගලයින්ට ඇති ප්‍රවේශය අධ්‍යනය කරන ලදී. මහිදි පනේ ගිය මූලික කරුණක් නම් බොහොමයක් තෝරා ගත් රාජ්‍ය ආයතනයන්හී ආබාධ සහිත පුද්ගලයින්ට ස්වෛත්‍යභාවයනේ ප්‍රවේශවී තම අවශ්‍යතා සපුරා ගැනීමට තරම් සුදුසු වන ආකාරයේ භෞතික ප්‍රවේශයක් නොා තිබනෙ බවයි. ඒ ඒ ආබාධිතබව සම්බන්ධයනේ ඇති ප්‍රවේශ පහසුකම් ඉහත රාජ්‍ය ආයතන තුළ සපයා ඇති ආකාරය පිළිබඳ පහත සාකච්ජා කරෙේ.

4.2 දෘෂ්‍යාබාධ සහිත කාන්තාවන් සඳහා **ඇති භෞතික ප්‍රවේශය**

දෘෂ්‍යාබාධිතබව යන්නට පූර්ණ අන්ධතාවය සහ අර්ධ අන්ධතාවය යන කොටස් දකෙම ඇතුළත් වේ. මමෙ දපොර්ශවයටම සහාය වන පරිදි පොදු ගොඩනැගිලි හා සේවා සැපයීමේ ස්ථාන සැකසිය යුතු ආකාරය 1996 ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීමේ පනත යටතේ 2006 වසරේ විශේෂ ගැසට් පත්‍රයක් යටතේ නිකුත් කළ ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශය සඳහා වූ රගුලාසි මගින් පැහැදිලිව දක්වා ඇති අතර සෑම රාජ්‍ය ආයතනයක්ම එම රගුලාසි අනුගමනය කළ යුතු බවටද එහි දක්වා ඇත. මමෙ රගුලාසි වලට අනුව දෘෂ්‍යාබාධ සහිත පුද්ගලයින්ට ස්පර්ෂය මගින් සිය ගමන් කළ යුතු මාර්ගය, පිවිසුම් දොර ආදිය දැක්වනෙ ටැක්ටයිල් කැට එසේත් නොමැතිනම් මාර්ගෝපදේශ ගල් පිවිසුම් මාර්ග සහ පිවිසුම් දොරටු ආයතනයේ ප්‍රධාන පිවිසුම් ගේට්ටුව අසල සිටම අල්ලා තිබීම, පඩි, සේවා කවුළු, සේවා පිවිසුම් දොර ආදිය පැහැදැලිව දැකිය හැකි වන ලසෙ (අර්ධ අන්ධබාවය සහිත පුද්ගලයින් සඳහා) එකිනකෙට වනෙස වර්ණයන්ගනේ යුතුව සැකසීම ආදිය පිළිබඳ නිර්දේශ සපයයි.

මමෙ අධ්‍යයනයට අනුව තෝරා ගත් රාජ්‍ය ආයතන 21ත් ඒ ඒ සේවා සපයන ප්‍රවේශ 26මත් අතරින් කිසිදු ආයතනයක් දෘෂ්‍යාබාධිත පුද්ගලයින්ට ස්වාධීනව තම ප්‍රවේශය සකසා ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශක ගල් සවි කර නොා තිබුනු බව දක්නට ලැබුනි. සුදු සැරයැටියක ආධාරයෙන් ගමන් කරන පුද්ගලයකුට උක්ත මාර්ගෝපදේශක ගල් දමා ගමන් කල යුතු දිශාව සොයා ගැනීම සඳහා ඉමහත් ලසෙ උපකාරී වේ. කසෙේවෙතත් මමෙ ආයතනවල මූලිකව ප්‍රවේශය අවශ්‍ය වන අංශ ලසෙ හඳුනා ගත හැකි රථගාල, ප්‍රධාන ප්‍රවේශය, පිලිගැනීමේ අංශය, සේවා කවුළු, ආයතන ප්‍රධානියාගේ කාර්යාලය සහ වැසිකිලි ආදී අනකුත් පොදු පහසුකම්වලට ප්‍රවේශවීමට ඇති මාර්ගවල මමෙ මාර්ගෝපදේශක ගල් සවි කර නොා තිබුනි.

රාජ්‍ය **ආයතන** මගින් ලබා දනෙ වැසිකිලි පහසුකම් කරෙහි **ඇති භෞතික ප්‍රවේශය** ද මමෙ අධ්‍යනයේ අවධානයට යොමු වන ලදී. මහිදි වැසිකිලි දෘශ්‍යාබාධ සහිත කාන්තාවන්ට පරිහරණය කළ හැකි **ආකාරයට** සැකසූ **ඒවා** ද යන්න සොයා බැලිණි. **කොමොඩ්, සේදුම් බේසම් ආදී** උපාංග සවි කර **ඇති** බිත්ති වැසිකිලියේ අනකුත් බිත්ති අතරින් වනෙස කැපිපනෙන වර්ණ වලින් වර්ණ ගැන්වී තිබේදැයි මහිදි නිරීක්ෂණය කරෙණි.

සේවා සපයන **ආයතනයන්හි** මහජනතාව සඳහා වනේකර තිබූ කිසිදු වැසිකිලියක් මේ සම්බන්ධයනේ අවධානය යොමු කර නැති බව දැක්විය හැකිය. එවැනි අවස්ථාවන්හිදී දෘෂ්‍යාබාධ සහිත පුද්ගලයින්, විශේෂයෙන්ම කාන්තාවන්ට වැසිකිලි යාම වැනි අතිශය ඊපදේගලික අවශ්‍යතාවයකදී ද වනෙත් පුද්ගලයකුගේ සහාය ඉල්ලා සිටීමටත් ඔවුන් මත යැපීමටත් සිදු වේ.

උක්ත නිගමනය වඩාත් පසක් කර ගැනීමේලා මමෙ අධ්‍යනය මගින් සිදු කල සිද්දි අධ්‍යනයන් රුකුල් සපයයි. නිදසුනක් වශයනේ දෘෂ්‍යාබාධිත කාන්තාවක්වූ අකිලා මහත්මිය ඈ අනුරාධපුර මහරෝහලින් සේවා ලබා ගැනීම ගැන සඳහන් කරමින් වරක් මසෙේ පැවසිය.

"මට ඇස් පේන එක අඩු නිසා ඇවිද ගනෙ යද්දි ටිකක් අමාරුයි. දවසක් පඩියක් පැටලිලා මම වැටිලා කකුලත් තුවාල වුණා. ගොඩක් ආයතනවල පඩිපළෙවල් තමයි තියනේනේ. මම ගදෙර කනෙකේ එක්ක තමයි ගොඩක් වලොවට යන්නේ කාර්යාලවලට යද්දි. මොකද එහමෙ නැත්තම් හොයා ගන්න එහමෙ අමාරුයි මට. ඉස්පිරිතාලනේ ඕ.පී.ඩී. එකට නගින්න තියනෙවා පඩිලකේ එකනේ මාව අල්ලගනෙ තමයි ආවිවි එක්ක ගනෙ යන්නේ. බහෙනේ තුණ්ඩුවක් අරගන්න අපි පෝලිමට යන්න ඕන ඒ තුණ්ඩු දනෙ නැන තියනේනේ එක නැනක, බහෙනේ ගන්න පෝලීමේ ඉන්න ඕන තව නැනක. එක ළගම ඒ නැන් තියනෙවා නම් ලේසියි අපිට".

උක්ත ප්‍රකාශය මගින් පනේ යන්නේ ආබාධ සහිත පුද්ගලයින්ට හිතෛෂී නොවන හෞතික ප්‍රවේශයන් හේතු කර ගනෙ ඔවුන්ගේ ආබාධිතතාව වඩාත් තීව්‍ර වී ඇති බවයි. ඇගේ ප්‍රකාශය හරහා ගම්‍යවන හෞතික ප්‍රවේශය හා බැඳි තවත් වැදගත් කරුනක් වන්නේ බොහොමයක් රාජ්‍ය ආයතන තුල දැකිය හැකි පිරිසැලසුම ආශ්‍රය කරගත් අපහසුතාවයන්ය. කලින් කලට සිදු කරන්නාවූ ප්‍රතිසංස්කරණ සහ නව ඉදිකිරීම් හෝ, ආරම්භයේ සිටම යම් යම් ගොඩනැගිලිවල පිරිසැලසුමේ පැවති අඩුපාඩු හේතුවෙන් හෝ එක් ආයතනයක් තුල පිහිටි සේවා සැපයනෙ ස්ථාන එකිනකෙනේ වනේව, දුරස්ථව පිහිටන ස්වරූපයක් බොහෝ ආයතනවල දැක ගත හැකි වේ. උක්ත තත්වය හේතුවෙන් එකම ආයතනය තුල අනවශ්‍ය පරිදි එහා මහො ගමන් කිරීමට සිදුවීම ආබාධ සහිත පුද්ගලයකුට අභියෝගාත්මක විය හැකිය. අකිලාගේ අත්දැකීමනේ මමෙ ගැටලුව තුළ ඇති අනකුත් සමාජාර්ථික ගැටලු ද ඉස්මතු වේ. ඇයට රෝහල තුල තනිවම කටයුතු කර ගැනීමේ පහසුකම් නැති බැවින් ඇයගේ මිත්තණිය කැටුව යාමට සිදු වීම, ඒ සම්බන්ධයනේ ඇයට දැරීමට සිදුවන අනවශ්‍ය ප්‍රවාහන වියදම් සහ අවශ්‍ය පහසුකම් සැපයීමේ ගැටලු හේතුවෙන් ඇයට තවදුරටත් අනතුරු සහ අවදානමට ගොදුරු වීමට ඇති ඉඩ වැඩි වීම ආදිය ද මින් ගම්‍ය වේ. වර්ෂ 2014 ජාතික දෘශ්‍යබාවය,දෘෂ්‍යාබාධ හා ආබාධිතබව පිළිබඳ සිදු කරන ලද සම්ක්ෂණයක් මගින් ශ්‍රී ලංකාවේ ආබාධ පුද්ගලයින්ගනේ සැලකිය යුතු ප්‍රමාණයක් කාන්තාවන් බවද අඩු සමාජ ආර්ථික මට්ටම් හා ග්‍රාමීය ප්‍රජාව අතර මයෙ තව දුරටත් වැඩි බවද මමෙ සම්ක්ෂණය හරහා පනේවා දී ඇත[1].

චලනාබාධ සහිත පුද්ගලයින් සඳහා පවතින හෞතික ප්‍රවේශයරෝද පුටු හා කිහිලිකරු භාවිත කරන පුද්ගලයින් හට ප්‍රවේශ පහසුකම් සකස් කිරීමේදී සපුරා ලිය යුතු එසේත් නැත්තම් ගොඩනැගිලි නිර්මාණය කිරීමේදී සැලකිය යුතු කරුණු රාශියක් ආබාධ සහිත පුද්ගලයින්ගේ ප්‍රවේශ අවශ්‍යතා රඟෙලාසි හි සඳහන් වේ. පඩි සහිත සෑම පිවිසුමක් සඳහා ම (ගොඩනැගිල්ල ඇතුළත වුවද) රඟෙලාසියහි සඳහන් නියමිත ප්‍රමිතියට අනුකූල බෑවුමක් සහිත සහ අත්වැලක් සහිත පිවිසුම් මාර්ගයන් සැකසිය යුතුය. රෝද පුටු භාවිත කරන පුද්ගලයාගේ උසට සරිලන සේවා කවුන්ටර, රෝද පුටු පහසුවනේ හරවා නැවත පැමිණීම සඳහා ඉඩකඩ, වසා නැඹනෙ දොරවල් පවතින අවස්ථා වලදී රෝද පුටු භාවිත කරන පුද්ගලයාට පහසුවනේ විවෘත කළ හැකි ආකාරයෙන් සැකසූ දොර හැඩල ආදී බොහෝමයක් මමෙ

[1] මූලාශ්‍රය http://stateminsamurdhi.gov.lk/web/images/content_image/notices/CRPD_initial_report.pdf

රහෙලාසි තුළට ඇතුළත් වේ. මමෙ අධ්‍යයනයේදී සලකා බැලුයේ ඒ ඒ ස්ථානය සඳහා රෝදපුටු හාවිත කරන්නකුට පිවිසීමට හැකි ප්‍රවේශ පහසුකම පමණකි.


සංසන්දනාත්මකව බලන විට උක්ත ආයතන අතරින් කිහිපයක්ම රෝද පුටු හෝ කිහිලිකරු හාවිතයනේ පැමිණෙන ආබාධ සහිත පුද්ගලයින් සඳහා වඩාත් සාදනීය ප්‍රවේශයක් ලබාදීමට කටයුතු කර ඇති බව පනේයයි. පහත සටහන මගින් සාරාංශගත කරන්නේ රෝදපුටු හෝ කිහිලිකරු හාවිතයනේ පැමිණෙන පුද්ගලයින් සඳහා තෝරා ගත් ආයතන 21 තුළ සේවා සැපයනෙ අංශ 26හි විවිධ සේවා අංශ සඳහා පැවති ප්‍රවේශයයි.

කසෙේවුවද සලකා බැලූ ආයතන 21න් 11කම කිසිදු අංශයකට රෝද පුටු හාවිත කර ප්‍රවේශ වී සිය සේවාව ඉටු කරගැනිමේ හැකියාවක් නොතිබිණි. එම ආයතන පහත දැක්වේ.

1. බස් නැවතුම්පොළ - නොච්චියාගම
2. පොලිස් ස්ථානය - නොච්චියාගම
3. ලංකා බැංකුව - නොච්චියාගම
4. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - නොච්චියාගම
5. මහජන බැංකුව- නොච්චියාගම
6. බස් නැවතුම්පොළ - තඹුත්තේගම
7. ලංකා බැංකුව - තඹුත්තේගම
8. මහජන බැංකුව- අනුරාධපුර
9. මානව හිමිකම් කොමිෂන් සභාව- අනුරාධපුර
10. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර

පහත දැක්වනේනේ ඉතිරි ආයතන 11 සහ රෝහලේ විවිධ අංශ (5) තුළ පැවති ප්‍රවේශ පහසුකම් පැවති ආකාරයයි.

ප්‍රවේශ පහසුකම් සකසා තිබූ රාජ්‍ය **ආයතනයන්හි ඒවා** සැකසි තිබූ **ආකාරය**



වැඩිම ආයතන සංඛ්‍යාවක් එනම් ආයතන 10ක් (38%) ඒවායේ ප්‍රධාන ප්‍රවේශය සහ සේවා අංශය සඳහා ප්‍රවේශය රෝද පුටු හාවිත කරන්නන් සඳහා සරිලන ලසෙ සකසා තිබිණි. ආතනයේ පිළිගැනිමේ අංශයට ප්‍රවේශය සලසා දී තිබුණේ ආයතන 3ක් (12%) පමණි.

මේ අනුව පනේ යන්නේ තෝරාගත් රාජ්‍ය **ආයතන** අතරින් කිහිපයක් රෝදපුටු හෝ කිහිලිකරු හාවිතා කරන **ආබාධ** සහිත පුද්ගලයින්ට අවශ්‍ය සාධාරණ ප්‍රවේශය ලබාදීමට කටයුතු කර **ඇති** බවයි.

තඹුත්තේගම ප්‍රාදේශිය සභාව, පොලිස් ස්ථානය සහ මූලික රෝහල යන **ආයතනයින්හී** ජාත්‍යන්තර ප්‍රමතියට ඉදි කරන ලද බැවුම් මාර්ග දක්නට ලැබුනි. තව දුරටත් තඹුත්තේගම මූලික රෝහලේ හාහිර රෝගී අංශය, නේවාසික රෝගී අංශය, සායනික අංශය, ප්‍රසව **ඒකකය** සහ හදිසි රෝගී ප්‍රතිකාර අංශය යන අංශ සඳහා උක්ත පිවිසුම් පැවති බව නිරීක්ෂණය කල හැකි විය. මීට අමතර ව, අනුරාධපුර නැගෙනහිර තුවර ගම්පලාත ප්‍රාදේශීය සභාවට අයත් මධ්‍යම බස් නැවතුමහි ද මවැනි ජාත්‍යන්තර මට්ටමේ බැවුම් මාර්ගයක් දක්නට ලැබේ. තව දුරටත්, ප්‍රාදේශිය ලේකම් කොට්ටාස තුනට ම අයත් විවිධ රාජ්‍ය **ආයතනයන්හී** ජාත්‍යන්තර ප්‍රමිතියට නොමැති වුවද රෝද පුටු හෝ කිහිලිකරු හාවිතා කරන තැනැත්තන් උදසෙ බැවුම් මාර්ග සකස් කර තිබනෙ අයුරු දක්නට ලැබුනි. මීට අමතරව, **ආයතන** ප්‍රධානියාගේ කාර්යාලය සඳහා ප්‍රවේශවීමට බැවුම් මාර්ග පැවතියේ තඹුත්තේගම ප්‍රාදේශීය සභාව, පොලිස් ස්ථානයේ සහ අනුරාධපුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ පමණක් බවද මහෙදි නිරීක්ෂණය කරන ලදී. ප්‍රමිතියනේ නොර බැවුම් මාර්ග වලින් රෝද පුටු ගනෙයාමේදී එය ඉහළට තල්ලු කිරීමට දැනනේ අතිශය ශක්තියක් වැය කළ යුතුය. **ඇතැම්** විට එම බැවුම් මාර්ග **ආපසු** පැමිණිමේදී රෝද පුටු වේගයෙන් බිමට ලිස්සා යාමනේ අනතුරු ද **ඇති** වේ. බැවුම් නිසි **ආකාරයෙන්** සැකසුව ද අත්වැල නොමැති වීමනේද මමෙ අනතුරු **ඇති** විය හැකිය.

උක්ත බැවුම් මාර්ගයක අවශ්‍යතාව මතු වන්නේ එය පඩිපලෙක අවශ්‍යතාවයට විකල්පයක් සපයන බැවිනි. එමගින් රෝද පුටු හාවිතා කරන තැනැත්තන්ට ඉතා පහසුවනේ හෞතික ප්‍රවේශය සකස් කර ගැනීමට අවස්ථාව උදා වේ. මාර්ගෝපදේශක ගල් සවි කර තිබීමට සාපේක්ෂව බැවුම් මාර්ග සකස් කර තිබීම සාධනිය තත්වයක් පනේනුම් කරන බව උක්ත සාකච්ජාව තුලින් පනේ යයි. එසේ වුවද, එම පහසුකම අධ්‍යනයට ලක් කල සැම **ආයතනයක්** තුල ම එය ඉතා සමබරව පවතින බවක් නිරීක්ෂණය කල නො හැකි විය. එවැනි පහසුකම් නොමැති රාජ්‍ය **ආයතන** වනෙ **ඇවිදීමේ** අපහසුතා සහිත පුද්ගලයින් සේවා අවශ්‍යතා සඳහා පැමිණි අවස්ථාවන්හිදි රාජ්‍ය නිලධාරීන් ඔවුන්ට ප්‍රතිචාර දක්වන **ආකාරය** සමහර රාජ්‍ය නිලධාරීන් සිදු කර ප්‍රකාශ ඔස්සේ අවබෝධ කර ගත හැකි වේ. මමෙ අධ්‍යනය සඳහා සම්මුඛ සාකච්ජා පැවැත්වූ බොහොමයක් රාජ්‍ය නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලද්දේ එවැනි අවස්ථාවකදී අදාල රාජ්‍ය නිලධාරියා අදාල තැනැත්තා වනෙ කෙදවා එම සේවා ලබාදීමට කටයුතු කල බවයි. මයෙ වඩාත් ප්‍රායෝගික විසඳුමක් වශයනේ බැලූ බැල්මට පනේ යන නමුත් එමගින් අදාල පුද්ගලයින්ට සේවා සැපයීමේදී අනවශ්‍ය ප්‍රමාදයක් **ඇතිවීම**, රාජ්‍ය නිලධාරියා සහ **ආබාධ** සහිත පුද්ගලයා අතර කෘතඥතාවය පදනම් කර ගත් අනවශ්‍ය බල අසමතුලිතයක් **ඇති**

වීම වැනි ගැටලුවලට එය මග පාදනු **ඇත.** මහල් ගොඩ නැගිලි පවතින අවස්ථාවන්හිදී **ආබාධ** සහිත පුද්ගලයා දැනීන් හොවා ඉහළට ගනෙ යෑම ද ඉතා කාර්යක්ෂම ක්‍රියාවක් ලසෙ දුටුව ද ඉන් **ආබාධ** සහිත පුද්ගලයාගේ අභිමානයට හානිදායක වන අතර, **ආබාධ** සහිත පුද්ගලයා කාන්තාවක් නම් **ඇය** අතිශය අපහසුතාවට ද ලක්වේ.

ආයතනය විසින් සේවාලාභීන් සඳහා වනේකර **ඇති** වැසිකිලි වලනාබාධ සහිත කාන්තාවන්ට පරිහරණය කළ හැකි **ආකාරයට** සැකසූ **ඒවා** ද යන්නද නිරීක්ෂණය කරෙණි. මහෙදී සලකා බැලූයේ වැසිකිලිය තුලට රෝදපුටුවක් **ඇතුළ්** කළ හැකි අයුරින් එය සකසා තිබීම, කොමාඩ්, සහ **ආධාරක** පොලු සේදුම් බේසම ප්‍රවේශවිය හැකි උසකින් තිබීම කාන්තාවන්ට සනීපාරක්ෂක තුවා බැහැර කළ හැකි කසල බඳුන් පවතිද යන කරුණු වේ. මහෙදී නිරීක්ෂණයට ලක් කළ **ආයතන** අතරින් මමෙ නිර්ණායකයන් සලකා බලා පහසුකම් සලසා තිබුනේ **ආයතන** දකෙක් පමණි. **ඒ** තඹුත්තේගම මහේස්ත්‍රාත් උසාවිය සහ තඹුත්තේගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයයි.

4.3 භෞතික ප්‍රවේශ ස්ථාපිත කිරීමට පවතින බාධා හා අභියෝග

<u>ගොඩනැගිලි</u> අලුත්වැඩියා කිරීමේ බාධා

මමෙ අධ්‍යනය මගින් භෞතික ප්‍රවේශ සාධාරණ ප්‍රවේශ අවශ්‍යතා තහවුරු වන ආකාරයෙන් නවීකරණය කිරීමේදී රාජ්‍ය නිලධාරීන්ට මුහුණදීමට සිදු වන ඉතා සුවිශේෂීවූ අභියෝග කිහිපයක්ද හඳුනා ගන්නා ලදී[2]. පහතින් දක්වා ඇත්තේ එම අභියෝගයන්ය.

1. පරණ ගොඩනැගිලි හේතුවෙන් ඒවායේ වනෙස්කම් අමාත්‍යාංශය හරහා ම සිදු කළ යුතු වීම
2. පෞද්ගලික ගොඩනැගිල්ලක රාජ්‍ය ආයතනය පවත්වාගනෙ යන බැවින් භෞතික වනෙස්කම් ද සිදු කළ නොහැකි වීම

කසෙේවෙතත් මමෙ අධ්‍යනය සඳහා එක් රැස් කර දත්ත විශ්ලේෂණයේදී පනෙ යන්නේ අලුතින් ඉදි කරන ලද ගොඩනැගිලිවලද ආබාධ සහිත පුද්ගලයන් සඳහා පැවතිය යුතු සාධාරණ ප්‍රවේශ පහසුකම් දක්නට නොලැබනෙ බව යි. මමෙ වාර්තාවේදී අලුතින් ඉදි කරන ලද ගොඩනැගිලි වශයනේ සලකනු ලබන්නේ 2006[3] වසරනේ පසුව ඉදි කල බවට රාජ්‍ය නිලධාරීන් විසින් හඳුනා ගත් ගොඩනැගිලි වේ. මේ අනුව

- බස් නැවතුම්පොළ - තඹුත්තේගම
- මහජන බැංකුව- අනුරාධපුර
- පොලිස් ස්ථානය- අනුරාධපුර
- කාන්තා හා ළමා කාර්යාංශය - අනුරාධපුර
- මධ්‍යම බස් නැවතුම්පළ

[2] මලෙසෙ හඳුනා ගත් අභියෝග අතරින් මූලිකත්වයක් ගන්නේ ප්‍රතිපාදන සම්බන්ධව පවතින ගැටලු වේ. උක්ත ගැටලුව මමෙ වාර්තාවේ අනකුත් අංශ හා බැඳනෙ බැවින් එය වනෙම වාර්තාව තුල ආමන්ත්‍රනය කර ඇත.

[3] 2006 වසරේදී ආබාද සහිත පුද්ගලයන් සඳහා සාධාරණ ප්‍රවේශය ලබාදීම සම්බන්ධ රගුලාසි ලක් රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ඉහතින් සඳහන් කර පරිදි එහි තවෙන වගන්තිය මගින් අලුතින් ඉදි කරන හෝ ප්‍රතිසංස්කරණය කරන ගොඩනැගිලි එසේ දක්වා තිබූ රගුලාසිවලට අනුගත විය යුතු බව දක්වා තිබේ. එබැවින් 2006 වසර මමෙ සටහන සඳහා කඩයිම වශයනේ යොදු ගන්නා ලදී.

යන රාජය ආයතන 2006 වර්ෂයේ පසුව ඉදිකරුණ ඒවා බවට හඳුනා ගත් අතර ඒවා නිරීක්ෂණයේදී අවබෝධ වූයේ පොලිස් ස්ථානය, කාන්තා හා ළමා කාර්යාංශය අනුරාධපුරය හා මධ්‍යස බස් නැවතුම්පල යන ආයතනයන් පමණක් ප්‍රවේශ වීමට චලනාබාධිත පුද්ගලයින් සඳහා බෑවුම් මාර්ගයක් පමණක් පවතින බවයි. අනෙක් ආයතන දකෙහි අබාධ සහිත පුද්ගලයින් සඳහා තිබිය යුතු කිසිදු ප්‍රවේශ පහසුකමක් නොතිබිණි. මේ අනුව පනේ යන්නේ ආබාධ සහිත පුද්ගලයින්ට ලබා දිය යුතු සාධාරණ හේතික ප්‍රවේශය කරෙහි යොමු වන අවධානය තවමත් ප්‍රමාණවත් මට්ටමක නොා පවතින බවයි.

විවිධ **ආබාධිත** තත්ත්වයන් පිළබඳ රාජය නිලධාරීන් සහ තිරණ ගැනිමේ බලධාරීන්ගේ **ඇති අනවබෝධය**

හේතික ප්‍රවේශය සම්බණ්ධයනේ රාජය නිලධාරීන් දක්වා තිබූ අදහස් සලකා බැලිමේදී තව දුරටත් නිරීක්ෂණය කල හැකිවූ කරුණක් නම් ඔවුන් අතර එක් එක් ආබාධිතතාවය නිසා පැන නැගින විශේෂිතවූ ප්‍රවේශ අවශ්‍යතා සම්බන්ධයනේ පැහැදිලි සහ නිරවද්‍ය අවබෝධයක් නොමැති බවයි.මන්දයත් බොහොමයක් රාජය නිලධාරීන් පඩිපලේ නැගිම දෘෂ්‍යාබාධිත පුද්ගලයින්ට කල නොා හැකි හෝ කිරීමට අපහසු කරුනක් ලසෙ දක්වා ඇති බවක් දක්නට ලැබුනි. මන්ද තම ආයතනය තුල දෘෂ්‍යාබාධිත පුද්ගලයින්ට ප්‍රවේශවීමට නොහැකි සේවා හඳුනා ගැනිමේදී ඔවුන් බොහෝ විට ඒ සඳහා යොදු ගත් නිර්ණායකය වශයනේ පනේ යන්නේ එම සේවාවන් උඩුමහලේ පිහිටා තිබීමයි. පඩිපලේ නැගිම යම් දෘෂ්‍යාබාධිත පුද්ගලයන් හට තම ආබාධය වනෙත් ආබාධයක් හා බැඳි ඇත්නම් හෝ එම නැගිමට ඇති පඩි ප්‍රමිතියනේ තොර වන්නේ නම් වැනි අවස්ථාවන්වලදී අභියෝගාත්මක විය හැකිය. නමුත් එය දෘෂ්‍යාබාධිතතාවය හා බැඳුනු අනිවාර්ය අපහසුතාවයක් නොා වේ. කසෙේවෙතත් බොහොමයක් නිලධාරීන් දක්වා තිබූ පැහැදිලිකිරීම් මගින් අවබෝධ වන්නේ මේ සම්බන්ධයනේ ඔවුන් අතර පවතින අනවබෝධයයි. තව දුරටත් ඒ ඔස්සේ විවිධ ආබාධිතතාවයන් සම්බන්ධයනේ සමාජයේ ඇති දුර්මතවල ඇති ප්‍රභලත්වය ද වටහා ගත හැකි වේ. එවැනි දුර්මත විවිධ ආබාධ සහිත පුද්ගලයින් සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපාදන සකස් කිරීමේදී ගැටලුකාරී විය හැක්කේ එවැනි අවස්ථාවකදි අප පිලිතුරු සොයන්නේ අදාල ප්‍රශ්නයට නොව වනෙත් යමකට විය හැකි බැවිනි. මමෙගින් ගම්යවන්නේ රාජය නිලධාරීන් අතර විවිධ ආබාධිතතා සහ එම ආබාධිතතා ඔස්සේ පැන නැගිය හැකි සාධාරණ අවශ්‍යතාවයන් සම්බන්ධයනේ අවබෝධය ගොඩනැගීමේ අවශ්‍යතාවයක් පවතින බවයි. උක්ත කරුන හේතික ප්‍රවේශය සම්බන්ධයනේ පමණක් නොව, මමෙ වාර්තාව මගින් ගනෙ හැර දක්වන අනතුන් බොහොමයක් ගැටලු සමගින් ද ඉතා තදින් බැඳි තිබේ.

ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශ පහසුකම් සකසා දීම **ආබධ** සහිත පුද්ගලයින් සතු අයිතියක් බව අවධාරණය නොවීම

2006 අංක 1 දරණ ආබාධ සහිත පුද්ගලයන්ගේ ප්‍රවේශවීමේ අයිතිවාසිකම් සම්බන්ධ රගුලාසි යටතේ විවිධ ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශ පහසුකම් සැලසිය යුතු ආකාරය සහ ඊට අදාළ ප්‍රමිතින් රූප සටහන් ද යොදු ගනිමින් පැහැදිලිව දක්වා ඇත. එමනේම මමෙ රගුලාසි ගැසට් පත්‍රයක් මගින් පළ කර ඇත. එසේ තිබියදී ද එම රගුලාසි පිළිබඳ හෝ ආබාධ සහිත ප්‍රවේශ පහසුකම් සකසා දීම ආබාධ සහිත පුද්ගලයින් සතු අයිතිවාසිකමක් හෝ එය ලබා දීමට රජය බැදි සිටින බවක් බහුතරයක් රාජය නිලධාරීන්ගේ අදහස් තුලින් ප්‍රකාශ නොවුණි. බොහෝ විට ආබාධ සහිත පුද්ගලයින් හට සේවා සැපයීම හෝ

ඔවුන්ට හෞතික වශයෙන් ළඟා විය නොහැකි ස්ථානයන්හි නිලධාරීන් ආබාධ සහිත පුද්ගලයා වෙත පැමිණ කටයුතු කිරීම ඔවුනට සිදු කරන උපකාරයක් ලෙස සැලකිය යුතු රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාවකගෙන් අදහස විය. ප්‍රවේශ පහසුකම් සැකසීම උපකාරයක් නොව ආබාධ සහිත පුද්ගලයින්ගෙන් අයිතිය සාක්ෂාත් කිරීමක්ය යන අවබෝධය රාජ්‍ය සේවාව තුළ ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව ය ද මින් ගම්‍ය වේ.

5. ආබාධ සහිති පුද්ගලයින්ට සේවා සැපයීමේදී රාජ්‍ය ආයතන විසින් ගනෙ ඇති ක්‍රියාමාර්ග

මමෙ අධ්‍යනය මගින් එක් රැස් කර ගත් දත්ත අධ්‍යනය කිරීමේදී පනේ යන තවත් කරුනක් නම් ආබාධ සහිත කාන්තාවන් මුහුණදනෙ හෞතික ප්‍රවේශයේ ගැටලු අවම කරනු වස් ඇතැම් නිලධාරීන් විවිධ පියවර අනුගමනය කර ඇති බවයි. මීට නිදසුනක් නම් අනුරාධපුර නගරසභාවේ නගරාධිපතිවරයා විසින් සිදු කරන ලද ප්‍රකාශයකි. එකම ආයතනය තුල විවිධ ස්ථාන වනෙ ගමන් කර සේවා ලබා ගැනිමේ ඇති අපහසුතා මගහරවනු වස් ඔහු “පරෙටු කාර්යාලය තුළින් සියළු දේ කර දීම“ට කටයුතු කර තිබේ. මයෙ අනුලා මහත්මිය විසින් සිය අදහස් ප්‍රකාශනයේදී දැක්වූ අදහසක් සමගින් වඩාත් සම්පව විග්‍රහ කල හැකි වේ.

> “ඔක්කොම හොදයි කාර්යක්ෂමතාව මදි. දැන් හැමෝම කියනවා එක වහලක් යටින් හැමදෙම කරගන්න පුලුවන් කියලා, ඒත් ඒ,ජී ඔෆිස් එකට වැඩක් කරගන්න ගිහාම වහලවල් කියක් යටට යන්න ඕනෙද?ඔය ඔක්කොම කාර්යක්ෂම තාවය නැති කම“.

මේ අනුව පනේ යන්නෙ එක සේවා කවුලුවක් ඔස්සෙ සියලුම සේවා ලබාදීම උක්ත අභියෝග සඳහා ලබා දුන් ප්‍රායෝගික විසඳුමක් වන බවයි. නමුත් මමෙ විසඳුම් පුද්ගලානුබද්ද වන අතර, වඩාත් තිරසාර විසඳුම් සැකසීමකදී මවෙනි ක්‍රියාමාර්ග ප්‍රතිපත්තිමය රාමුවක් තුල ඉදිරිපත්වීම වැදගත් වේ.

5.1 තොරතුරු සඳහා ඇති ප්‍රවේශය

මීට පරෙ ප්‍රකාශ කල පරිදි බහුතරයක්වූ ප්‍රවේශය සඳහා ආබාධ සහිත පුද්ගලයින්ගෙ සාධාරණ පිවිසුම සම්බන්ධ අධ්‍යනයන් ප්‍රවේශය විග්‍රහ කරනුයෙ හෞතික ප්‍රවේශය යනුවනේ පමණි. එනමුත් මමෙ අධ්‍යනය තුල ප්‍රවේශය සම්බන්ධයනේ අපගෙ අර්ථකතනය එයින් ඔබ්බට ගිය එකකි.

මේ ආකාරයට සැලකිල්ලට ගැනනෙ එක් පුළුල් අංශයක් නම් රාජ්‍ය ආයතන විසින් සපයන තොරතුරු වනෙ ආබාධ සහිත පුද්ගලයින්ට ඇති ප්‍රවේශයයි. නිදසුනක් වශයනේ සේවා අවශ්‍යතාවයක් සම්පූර්ණ කර ගැනිමේදී තොරතුරු ලබා ගැනිමට සහ අදාල තොරතුරු ලබාදීම ඉහල වැදගත්කමක් උසුලයි. එම තොරතුරු නුවමාරුව ආබාධ සහිත කාන්තාවන්ට කොතෙකුත් හිතකර අයුරින් සිදු වන්නෙද යන්න අවබෝධ කර ගැනීම මමෙ අනුමානෘකාවෙ අරමුණ වේ.

මහේදී මමේ අධ්‍යනය සැලකිල්ලට භාජනය කරන මූලික ක්ෂේත්‍ර කිහිපයක් පවතී. ඉන් ප්‍රධාන වන්නේ තෝරාගත් රාජ්‍ය ආයතනයන් මගින් ලබාදෙන සේවා සම්බන්ධයෙන් සිදු කරෙනෙ දැනුවත් කිරීම් සඳහා ආබාධ සහිත පුද්ගලයින්ට ඇති ප්‍රවේශය අවබෝධ කර ගැනිමයි. මමෙ අධ්‍යනය මගින් එක් රුස කරගත් දත්ත විශ්ලේෂණයේදී මමෙ රාජ්‍ය ආයතන තම සේවා ප්‍රචාරනය සඳහා යොදු ගන්නා මූලික ක්‍රමවේද කිහිපයක් වටහා ගත හැකි විය. ඒවා නම්,

1. දැනුවත් කිරීම්
2. මාසික හමුවීම්
3. පුවත්පත්
4. දැන්වීම් ආදීවූ අනක්‍රුන් මුද්‍රිත මාධ්‍ය
5. වෙබ් පිටු
6. සමාජජාල වෙබ් අඩවි

උක්ත ක්‍රමවේදයන් අධ්‍යනයේදී පනේ යන්නේ මින් සමහරක් ආබාධ සහිත පුද්ගලයින්ට සෘජුව පරිහරණය කිරීමට නොහැකි බව යි. නිදසුනක් නම් පුවත්පත්, දැන්වීම් ආදීවූ මුද්‍රිත මාධ්‍ය භාවිතයේදී ආබාධ සහිත පුද්ගලයින් මුහුණදෙන ප්‍රායෝගික අපහසුතාවන්ය. මීට අමතරව බොහොමයක් රාජ්‍ය නිලධාරීන් වෙබ් පිටු සහ සමාජ මාධ්‍ය තම ප්‍රධාන දැනුවත් කිරීමේ මාධ්‍යන් ලෙස හඳුන්වාදනෙ ලදී. කෙසේවෙතත් අධ්‍යනයට සහභාගිවූ කිසිදු ආබාධ සහිත කාන්තාවක් තමා එවැනි මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ රාජ්‍ය සේවාවන් සම්බන්ධයනේ දැනුවත්වූ බව පවසා නැත. බොහෝ දුරට ඔවුන්ගේ දැනුවත්වීමේ මාදය තම් කටවචනයයි. අධ්‍යනයට සහභාගිවූ සුසිලා වැනි කාන්තාවන් තමා නිවැරදි තොරතුරු නොදැනිම නිසා රාජ්‍ය ආයතනවලට පැමිණ රස්තියාදුවූ අවස්ථාද පැහැදිලි කර සිටියාය. විශේෂයෙන්ම සමෘධි අරමුදල් ලබා ගැනිමේදී ඈ මේ අපහසුතාවයට මුහුණදුන් බව සඳහන් කරන ලදී. මීට සමාන අත්දැකීමක් විශ්‍රහ කල අකිලා ආවේගශීලී හඩකින් මසෙේ පැවසුවාය.

> *“මිස මට සමෘද්ධි බැංකුවේ නම් ගොඩක් අපහසුතාවලට මුහුණ දනේන සිදද උනා. එහනේ සල්ලි ගන්න ගිහාම එක දවසකට අංක 100යි දනේනෙ. උදේ පාන්දරම ගිහින් ඒ අංක ගන්න ඕනෙ. අංකයක් ගන්න බැරි උනොත් එදාට සල්ලි ගන්න වනේනෙ නැ. පහුගිය දවස ටිකේ අපට දනෙ ආධාර සල්ලි ගන්න යන්න උනේ සමෘද්ධි බැංකුවට. දවස දකෙක් විතර අංක ගන්න බැරුව ආපහු හැරිලා එන්න උනා. සමහර දවස වලට ත්‍රී විල්වලට සල්ලි දිලා ගිහිල්ලා අපට ආධාර සල්ලි ගන්න බැරිවනෙ දවස තියනෙවා“.*

තොරතුරු ලබාදීමේ ක්‍රමවේදයක් වශයනේ මාර්ගගත ක්‍රමය ආබාධ සහිත පුද්ගලයින් හට වඩාත් සාර්ථක ක්‍රමවේදයක් බවට පත් කර ගැනිමේ හැකියාවක් පවති. නමුත් ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම්වල පැවැත්ම මහේදී අනිවාර්ය වේ. ශාක්ෂරතාවය, තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳ අවබෝධය, තාක්ෂණික මවෙළම් සඳහා ඇති ප්‍රවේශය මහේදී වැදගත් වේ.

මේ දත්ත විශ්ලේෂණයේදී පනේ යන්නේ රාජ්‍ය ආයතන තමා සේවා සම්බන්ධ තොරතුරු ලබාදීමේ ක්‍රමවේදයන් සහ එම ක්‍රමවේදයන් කරෙහි ආබාධ


සහිත පුද්ගලයින්, විශේෂයෙන්ම ආබාධ සහිත කාන්තාවන් ප්‍රවේශ වන්නේ කෙසේද යන කරුනු අතර මීට වඩා සම්බන්ධීකරණයක අවශ්‍යතාවක් පවතින බවයි. ඒ ඔස්සේ ඔවුන් මුහුණදෙන අපහසුතා රැසක් මගහැරවීමට ඉඩකඩ විවර වනවා පමණක් නොව, වඩාත් ගුණාත්මක සේවා සැපයීමක් ලබා ගැනීමට ද ඉඩ සැලසනු ඇත.

5.2 දෘෂ්‍යාබාධ සහිත පුද්ගලයින්ට තොරතුරු සඳහා ඇති ප්‍රවේශය

මීට අමතරව, මෙම අධ්‍යනය මගින් රාජ්‍ය ආයතන වෙත ප්‍රවේශවී සේවා ලබා ගැනීමට අදාලව තොරතුරු වෙත ප්‍රවේශවීමේදී ආබාධ සහිත කාන්තාවන් මුහුණදෙන ගැටලු කිහිපයක්ද හඳුනා ගන්නා ලදී. විශේෂයෙන්ම, මෙම අධ්‍යනයේදී නිරීක්ෂණය කල රඳාකායට මෙම රාජ්‍ය ආයතනයන්හී ආබාධ සහිත පුද්ගලයන් හට තොරතුරු සඳහා සාධාරණ ප්‍රවේශයක් ලබාදීම සම්බන්ධයෙන් යොමුවී ඇත්තේ ඉතා අල්ප අවධානයකි. එක් අතකින් ගත් කල දෘෂ්‍යාබාධිත පුද්ගලයින් තොරතුරු වෙත ප්‍රවේශවීමේදී අත් දකින අපහසුතා සැලකිය හැකි වේ. මේ අතරට නාම පුවරු කියවා ගත නොහැකි වීම, දැන්වීම් සහ වෙනත් තොරතුරු පත්‍රිකා කියවා ගත නොහැකි වීම, පෝරම තමා විසින් කියවා ගැනීමට හෝ පිරවීමට නොහැකි වීම දැක්විය හැකි ය. මීට මූලික හේතුව වන්නේ දැන්වීම්, නාම පුවරු සහ පෝරම ආදිය මුද්‍රිත මාධ්‍යයෙන් පමණක් පැවතීම යි.


සාකච්ජා කල නිලධාරීන් කිසියම් හෝ අවස්ථාවක දෘෂ්‍යාබාධ කාන්තාවකට සේවා සපයා ඇත්දැයි කල විමසීමේදී සැලකිය යුතු නිලධාරීන් සංඛ්‍යාවක් සේවා සපයා ඇති බව දක්නට ලැබිණි. ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

දෘශ්‍යාබාධ සහිත කාන්තාවකට සේවා සැපයීම



මෙසේ සේවා සැපයීමේදී ලිඛිත තොරතුරු පරිශීලයේදී නිලධාරීන් විසින් හෝ ඒවා කියවා දෙන බවත්,
එසේත් නැතිනම් දෘෂ්‍යාබාධ සහිත පුද්ගලයා සමග පැමිණෙන පුද්ගලයාගේ උපකාරය ඔස්සේ එම කටයුතු සිදු කරෙන බවත් පැහැදිලි වුණි. බ්‍රේල් මගින් හෝ පටිගත කල හඬ පට මගින් තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාවක් කිසිදු ආයතනයක් සතු නොවුණි.


දෘශ්‍යාබාධ සහිත කාන්තාවකට **ආයතනයේ** ලිඛිත තොරතුරු, දැන්වීම් පුවරු වනෙ ප්‍රවේශවීමට **ඇති** හැකියාව



මමෙ ප්‍රතිචාරයන් අධ්‍යනය කිරීමේදී පනේ යන්නේ දෘෂ්‍යාබාධිත පුද්ගලයකුට තොරතුරු වනෙ පිවිසීම සඳහා වනෙත් පුද්ගලයකුගෙ උපකාර අත්‍යවශ්‍ය වන බව යි.

අදාළ ආයතනය විසින් සපයන සියලු සේවාවන්ට දෘෂ්‍යාබාධ සහිත පුද්ගලයින්ට ගැටලුවකින් තොරව තනිව ප්‍රවේශ වීමට ඇති හැකියාව විමසන ලදි. මේ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

දෘශ්‍යාබාධ සහිත **සේවා** ලාභී කාන්තාවන්ට **ආයතනය** විසින් සැපයනෙ සියලුම **සේවා** ගැටලුවකින් **තොරව** තනිව ප්‍රවේශ වීමට **ඇති** හැකියාව



මහෙදි ඒ ඒ ආයතන මගින් සපයන සේවාවන් බහුතරයක් තොරාගත් සේවා කිහිපයක් පමණක් ප්‍රවේශවිය හැකි බවත් ආයතන/සේවා 5ක සේවා කිසිසේත්


දෘෂ්‍යාබාධ සහිත කාන්තාවන්ට තනිවම ප්‍රවේශවීමට හැකියාවක් නොමැති බවත් පැහැදිලි විය. අදාළ කොට්ඨාස 3හිම ප්‍රවාහන සේවා, පූස්තකාල සේවා සහ එක් කොට්ඨාසයක වනිතා සංවර්ධන සේවා මෙන් කිසිසේත් ප්‍රවේශ විය නොහැකි සේවා ලෙස නිලධාරීන් විසින් සඳහන් කර ඇත. මේ අතර සේවා ස්ථාන 5ක සේවා දෘෂ්‍යාබාධ කාන්තාවන්ට සම්පූර්ණයෙන්ම ප්‍රවේශ විය හැකි බවට ද සටහන් විණි. මේවා දිස්ත්‍රික් සමාජ සේවා කාර්යාලය, වනිතා සංවර්ධන සේවා, පොලිස් ස්ථානය තඹුත්තේගම, සමෘධි සංවර්ධන සේවා නොච්චියාගම සහ ග්‍රාම නිලධාරී, නොච්චියාගම අයත් වේ. කෙසේවුවද, මහිදි දෘෂ්‍යාබාධ සහිත කාන්තාවකට තනිව සේවා ලබාගත හැකි ය යන්න වටහා ගැනීමේ සහ එසේ සිදු කිරීම සඳහා සකස් කළ හැකි යටිතලපහසුකම් පිළිබඳ ඇති විවිධ අවබෝධ මට්ටම් ද මමෙ පිළිතුරු කරෙහේ බලපෑ ඇති බව කිව හැකිය.

5.3 ශ්‍රවණාබාධ සහිත පුද්ගලයින්ට තොරතුරු සඳහා ඇති ප්‍රවේශය

ශ්‍රවණාබාධිත පුද්ගලයින් සම්බන්ධ තත්වය ද මීට සමාන ස්වරූපයක් දරයි. මමෙ අධ්‍යනය සඳහා දත්ත එක් රැස් කර ගැනීමට දායකවූ සමහර රාජ්‍ය නිලධාරීන් තම සේවාදායකයින් සංඥා භාෂා සහය ලබාදීමට තම ආයතනවලට හැකි බව ප්‍රකාශ කරන ලදී. පහතින් දක්වා ඇත්තේ සංඥා භාෂා පහසුකම් සම්බන්ධයෙන් සිදු කළ නිරීක්ෂණයන්හි දත්ත සාරංශයකි.


සාකච්ඡා කළ නිලධාරීන් කිසියම් හෝ අවස්ථාවක ශ්‍රවණාබාධ සහිත කාන්තාවකට සේවා සපයා ඇත්දැයි කළ විමසීමේදී සැලකිය යුතු නිලධාරීන් සංඛ්‍යාවක් සේවා සපයා ඇති බව දක්නට ලැබිණි. ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ශ්‍රවණාබාධ සහිත කාන්තාවන්ට **සේවා** සපයා **ඇති** නිලධාරීන්



සාකච්ඡා කළ නිලධාරීන් 35 අතරින් 66%ක් ශ්‍රවණාබාධ සහිත කාන්තාවන්ට සේවා සපයා ඇති බව සඳහන් කර ඇත. මයෙ ද සැලකිය යුතු ප්‍රතිශතයකි. ශ්‍රවණාබාධ සහිත පුද්ගලයින් සමග සන්නිවේදනය සඳහා සංඥා භාෂාව භාවිත කළ හැකි නිලධාරීන් සිටීද යන්න සොයා බලන ලදී. මහේදී පහත තොරතුරු අනාවරණය විය.

ශ්‍රවණාබාධ සහිත පුද්ගලයින් සමග සන්නිවේදනය සඳහා සංඥා භාෂාව භාවිත කළ හැකි නිලධාරීන්



සාකච්ඡා කළ නිලධාරීන්ගෙන් 31%ක් එනම් 11 දෙනෙකු සංඥාව භාවිත කරන හේ වෙන්ත් පුද්ගලයෙකුගෙ සහාය ලබා ගනිමින් සේවාව සැපයිය හැකි බව සඳහන් කරෙණි. සාකච්ඡා කළ නිලධාරීන්ගෙන් සිව් දෙනෙකු ආබාධ සහිත කාන්තාවන්ගෙ සංගමය විසින් ලබා දී ඇති සය මස සංඥා භාෂා පුහුණු පාඨමාලාව මගින් සංඥා භාෂාව උගෙන ගෙන ඇති අතර අනෙකුත් නිලධාරීන් එසේ සංඥා භාෂාව උගෙන ඇති නිලධාරීන්ගෙ සහාය ලබා ගනිමින් සේවා සැපයීමට උත්සාහ ගන්නා බව සඳහන් විණි. මයෙ ඉතා සුවිශේෂී කරුණක් වන්නේ සංඥා භාෂාව හසුරුවිය හැකි නිලධාරීන් ජාතික මට්ටමේද ඉතා අතලොස්සක් සිටින බැවිනි.

සංඥා භාෂාව යොදු ගැනිමේ අවස්ථාව අහිමි අවස්ථාවන්හිදී බහුලව භවිත වන ක්‍රම වන්නේ

- අවශ්‍ය පණිවිඩය ලියා දැක්වීම මගින් සන්නිවේදනය කිරීම
- ආබාධ සහිත පුද්ගලයා සමග පැමිණෙන පුද්ගලයාගේ සහාය ඇතිව සේවා සැපයීම
- සන්නිවේදනය කළ හැකි පුද්ගලයෙකු සමග නැවත පැමිණීමට ඉල්ලා සිටීම


යන ක්‍රමයි.

කෙසේවුවද, සියලුම සේවා වෙත ප්‍රවේශ විය හැකි ද යන්නට සියලුම නිලධාරීන් ධනාත්මක ප්‍රතිචාර ලබා දී ඇත. මින් අදහස් වන්නේ සංඥා භාෂාව භාවිත කළ නොහැකි වුවද අනෙකුත් ඉහත සඳහන් ක්‍රම හරහා හේ යම් සේවාවක් සපයා දීමට හැකි ය යන අදහස පළ කරමින් බව ලබා දී ඇති ප්‍රතිචාර මගින් පැහැදිලි වේ.

5.4 වලනාබාධ සහිත කාන්තාවන්ට සේවා සැපයීම

වලනාබාධ සහිත කාන්තාවන්ට සේවා සැපයීමේදී ගැටලුවකින් තොරව සියලු සේවාවන් වෙත ප්‍රවේශ වීමට ඇති හැකියාව විමසීමේදී ලබා ගත හැකි වූ ප්‍රතිචාර පහත දැක්වේ.

වලනාබාධ සහිත කාන්තාවන්ට ගැටලුවකින් **තොරව** සියලු **සේවාවන්** වෙත ප්‍රවේශ වීමට **ඇති** හැකියාව



සේවා සපයන නිලධාරීන් අතරින් සේවා ස්ථාන 5ක නිලධාරීන් සිය ආයතනය සතු සියලු සේවා වලනාබාධ සහිත පුද්ගලයින් සඳහා ගැටලුවකින් තොරව ලබා ගත හැකි බව සඳහන් කර ඇත. මෙම සේවා ස්ථාන වන්නේ ලංකා බැංකුව නොච්චියාගම, මහජන බැංකුව තඹුත්තේගම, පොලිස් ස්ථානය තඹුත්තේගම, මහජන බැංකුව අනුරාධපුරය සහ දිස්ත්‍රික් සමාජ සේවා කාර්යංශයයි. අනෙකුත් සෑම සේවා ස්ථානයක් හා සේවා සපයන නිලධාරීන් ඇතැම් සේවාවන්ට පමණක් ප්‍රවේශය පවතින බව සඳහන් විය. මෙසේ සේවාව නොලැබීයාමට හේතුව ආයතනය තුළ ඒ ඒ සේවා ස්ථානයට සහ යටිතලපහසුකම් වෙත භෞතික වශයෙන් ප්‍රවේශ වීමට ඇති පහසුකම් සපුරා නොමැති වීම හේතුවෙන් ඇතිවන තත්වයක් බවද පැහැදිලි විය. කෙසේවුවද, සේවා අවශ්‍යතාවය මත අදාළ නිලධාරියා සේවාලාභියා වෙත ගොස් අවශ්‍ය සේවාව සැපයීමට කටයුතු කරන බව අනෙකුත් සියලුම රාජ්‍යායතන සඳහන් කර තිබිණි. මෙම යොමුව සේවා සැපයීමේදී සංවේදී හා සාධනීය තත්වයක් පනේනුම් කළද එසේ කිරීමේදී ඇති වන අකාර්යක්ෂමතාවය, සේවා ලාභියාට අවශ්‍ය පරිදි විවිධ සේවා ස්ථාන වෙත සහ නිලධාරීන් සමග සෘජුව සම්බන්ධව කටයුතු කිරීමට

නොහැකිවීම, ආත්මාභිමානය අහිමි වීම ආදී විවිධ සෘණාත්මක සාධක ද මහේ ගැඹව පවති.

මේ අනුව පනේ යන්නේ තොරතුරු කරෙහි ආබාධ සහිත කාන්තාවන්ට ඇති ප්‍රවේශය ඉතා අල්ප වන බවයි. යම් සේවාවක් ලබා ගැනීමේදී තොරතුරු සඳහා ප්‍රවේශවීමට අවශ්‍ය වන අවස්ථාවකදි තවෙන පාර්ශවයක සහය පැතීමට ඔවුන්ට සිදු වන බවක් ඒ අනුව පනෙන්නට තිබේ. මේ නිගමනයන් වඩාත් පැහැදිලි කර ගැනීමේදී රාජ්‍ය ආයතනයන්ගෙන් සේවා ලබා ගත් කාන්තාවන්ගේ අත්දැකීම් කිහිපයක් වතෙ යොමුවීම වැදගත් කොට සලකන්නමෙු. එසේ දැක්වූ අදහස් කිහිපයක් පහත පරිදි වේ.

> "මට මතකයි දවසක් මම ඉස්පිරිතාලනේ දුන්න ෆෝම් කොළයක් වැරදියට පුරවලා කියලා මට හොදටම බැන්නා. හරියට මේකවත් පුරව ගන්න බැරිද කියලා". අකිලා මහත්මිය

> "ඔන්ලයින් හරහා නම් අයදුම්පත් එහමෙ පුරවලා නෑ මම". සුසිලා මහත්මිය

මේ අනුව පනේ යන්නේ තොරතුරු ලබා ගැනීමේදී පවතින බාධාකාරී ප්‍රවේශය තම සේවා අවශ්‍යතා සපුරා ගැනීමේදී ආබාධ සහිත කාන්තාවන්ට යම් අභියෝගකාරී තත්වයක් උදා කර ඇති බවයි. තව දුරටත් ප්‍රතිචාරකයන්ගේ අදහස් විශ්ලේෂණයේදී පනේ යන්නේ ඔවුන් උක්ත අපහසුතා මගහරවා ගනු පිණිස තමාට මින් පරෙ කාරුණිකව සැලකූ රාජ්‍ය නිලධාරීන් ම සොයා යෑමට නැඹුරුකමක් දක්වන බවයි. මමෙ රාජ්‍ය නිලධාරීන් බොහෝ විට කාන්තාවන් වන බව දත්ත විශ්ලේෂණයේදී පැහැදිලි විය. මවෙනි තත්වයක් තුල කිසිදු බාධාවකින් තොරව තම සේවා අවශ්‍යතා සපුරා ගැනීමට ඔවුන්ට ඇති අයිතිය ඇහිරෙනවා පමණක් නොව, සේවාදායකයා සහ සේවාලාභියා අතර අසමතුලිත බල සම්බන්ධතාවයක් ඇතිවීම සඳහා ද මයෙ බලපාතු ලැබේ. උක්ත බල සම්බන්ධතාවය මමෙ පරිච්ඡේදයේ මිලග අනුමාතෘකාව ඔස්සේ සාකච්ඡා කරෙතෙු ලැබේ.

6. කාර්යමණ්ඩල නිලධාරීන්ට **ඇති** ප්‍රවේශය

මමෙ අධ්‍යනය හරහා අවධාරණය කරෙතෙ තවත් වැදගත් අංශයක් වන්නේ ආබාධ සහිත කාන්තාවන් රාජ්‍ය නිලධාරීන්ගේ සේවා ලබා ගැනීමේදී අත් දුටු අත්දැකීම් වේ. බහුතරයක්වූ මමෙ අත්දැකීම් මගින් පනේ යන්නේ ප්‍රතිචාරකයන් රාජ්‍ය නිලධාරීන් කරෙහි ධනාත්මක ආකපයක් දක්වන බවයි. කසෙේවෙතත් සමහර ප්‍රතිචාරකයින් මීට වනෙස්වූ අදහස් දක්වා තිබේ. පහත දැක්වනේනේ පද්මා මහත්මිය ඉදිරිපත් කල අදහසකි.

> "සමහර අවස්ථාවලදී අපිට අනිත් අයට වගේ පිළිගැනීමක් නැති වනෙවා. සමහර විට වනෙ කනෙකේ ආවේ නැත්තේ ඇයි වගේ ඒවා කියලා තියනෙවා. තනියනේද ආවේ වගේ ඒවා කියලා තියනෙවා. ".

ඉහත ප්‍රකාශය මගින් පැහැදිලි වන්නේ ආබාධිත පුද්ගලයන් යැපනේනන් හෝ අන්‍යන්ගේ උපකාර මත ජීවත්වන්නන්ය යන සමාජයේ ඇති දුර්මතයයි. මවෙනි ආකල්ප යම්

යම් අවස්ථාවන්හිදී සේවා සැපීම්වලදී මනුෂ්‍ය පනෙනෙ බවක් සමහර ප්‍රතිචාරකයන්ගේ අදහස් අඩියනය කිරීමේදී පනේ යයි. එවැනි දුර්මත ආබාධ සහිත පුද්ගලයාගේ ආත්ම අභිමානයට හානි කිරීමට ඉඩ ඇත. මීට සමාන අදහසක් එක් රාජ්‍ය නිලධාරියකු සිය සාකච්ඡාවේදී ප්‍රකාශ කලේය. ඔහු පැවසුවේ ‘‘අපි එයාලාගේ පෞද්ගලිකත්වයට බාධා කරනවාද කියලා වලොවකට හිතනෙවා‘‘ යනුවනේ. සේවාදායකයාගේ සහ සේවාලාබී ආබාධ සහිත පුද්ගලයා අතර නිරායාසයෙන්ම ගොඩනැගෙන සමීප සම්බන්ධය යම් අවස්ථාවකදී මවෙනි තත්වයන් දක්වා වර්ධනය වීමට ඉඩ තිබේ.

මමෙ සාකච්ඡාව ඉදිරියට ගනෙයාමේදී පහත ප්‍රතිචාර දිනවය වැදගත් ලසෙ සැලකිය හැකි වේ.

> ‘‘ඒජි ඔෆිස එකේ ඉන්න මිසලනම් එහමෙ නෑ. එයාලා ගොඩක් හොදයි. ෆෝම් එහමෙ පුරවන්න අපිට උදව් කරනවා. තේරෙන්නෙ නැති දේවල් තිබුනොත් ඒවත් පැහැදිලි කරලා දනෙවා ’’. පද්මා මහත්මිය

> “උදවු හම්බනෙවා වගේම සමහර දවස්වලට ඒ නොන්ලාටත් වැඩ වැඩි දවස්වලට අපි ගියාම අපිව වදයක් වගේත් හිතනෙවා ඇති කියලා මට හිතිලා තියනෙවා”. අකිලා මහත්මිය

ඉහත ප්‍රකාශ මගින් ගම්යවන්නේ මවෙනි සම්බන්ධතාවයන් තුලදී ආබාධ සහිත පුද්ගලයින් තමා යැපනේනකුෙය යන යථාර්ථය අන්තර්ග්‍රහනය කර ගන්නා ආකාරයයි. ඉහත අනුමානෘකාව තුලදී සාකච්ඡා කල පරිදි සේවාදායක රාජ්‍ය නිලධාරීන් සහ සේවාලාබී ආබාධ සහිත කාන්තාවන් අතර බොහෝ විට දැක ගත හැකිවූයේ අසමතුලිතවූ බල සම්බන්ධතාවයකි. මවෙනි සම්බධතාවල එක් අතුරු ප්‍රතිඵලයක් වන්නේ ආබාධිත පුද්ගලයින් තම අයිතිවාසිකම් අයිතිවාසිකම් ලසෙ නොව, තමාට ලැබනෙ උපකාර ලසෙ දුර්අවබෝධයක් ඇති කර ගැනීමයි. එය ආබාධ සහිත සමාජය බලගැන්වීමේදී අහිතකර ලසෙ බලපානු ඇත. උපකාර ලබා දනෙ නිලධාරියා සම්බන්ධයනේ යහපත් චරිත ලක්ෂණ ඈඳු ගනිමින් විග්‍රහ කිරීම මේ ආකාර සම්බන්ධතාවල මූලිකම ලක්ෂණයකි.

මවෙනි සම්බන්ධතාවල තවත් පැතිකඩක් අනුලාගේ පහත ප්‍රකාශයනේ පැහැදිලි වේ.

> “කාර්ය මණ්ඩලයනේ ගොඩක් උදව් ගන්න තනෙනේ මන්. මේ වනෙකොට මන් සමාජයේ යම් තත්වයක් හදාගනෙ ඉන්න හින්දා කාර්යමණ්ඩලයනේ ගොඩක් උදව් මට හම්බවනෙවා. ඒ උනාට මට වගේ තත්වයක් නැති ආබාධ සහිත කට්ටිය ගැන ඇත්තටම දුකයි. ඒ වගේ අයට මම උදව් කරනවා”.

ඉහත ප්‍රකාශයනේ ගම්යවන, සමහර ආබාධ සහිත පුද්ගලයින් අන්තර්ග්‍රහනය කරගත් දුර්මතයක් නම් තමාට සහය ලබා ගැනීම සඳහා තම වටිනාකම සමාජයට ඔප්පු කල යුතු බවයි. නමුත් රාජ්‍ය ආයතනයකින් සේවය ලබා ගැනීම තරාතිරම්හේදයකින් තොරව සෑම

පුරවැසියකුටම ලැබිය යුතු අයිතියකි. නමුත් එම අයිතිය බොහෝ විට මවෙනි දුර්මත හමුවේ යට යන බවට තර්ක කර හැකි වේ.

මේ අනුව පනේ යන්නේ, අතොලොස්සක්වූ සිදුවීම්වලට අමතරව ප්‍රතිචාරකයන්ට රාජ්‍ය නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමේදී අපහසුතා මතුවී තැති බව යි. කෙසේවෙතත් මමෙ නිලධාරීන් සහ ආබාධ සහිත පුද්ගලයන් අතර පවතින සම්බන්ධතාව සහ එහි බලපෑම් සම්බන්ධයනේ පුළුල් විමසුමක අවශ්‍යතාවයක් ද පවති.

7. තාක්ෂණික පහසුකම් කරෙහි **ඇති** ප්‍රවේශය

මමෙ අධ්‍යනයේ දත්ත විශ්ලේෂණය මගින් පැහැදිලි වන්නේ නව තාක්ෂණික ක්‍රමවේද සහ මවෙලම් සම්බන්ධයනේ ආබාධ සහිත පුද්ගලයින් අතර හෝ ඔවුන්ට සේවා සපයන නිලධාරීන් අතර පවතින අවධානය අල්ප වන බවයි. ඒ සඳහා බලපෑ හැකි හේතු කිහිපයක් මසෙේ දැක්විය හැකි ය.

1. ආබාධ සහිත පුද්ගලයන්ට භාවිතා කල හැකි තාක්ෂනික පහසුකම් සහ මවෙලම් සම්බන්ධ ඇති අඩු අවබෝධය
2. සාක්ෂරතාව අඩුවීම හෝ තාක්ෂණ දැනුම අඩුවීම
3. ඉංග්‍රීසි භාෂා දැනුමේ මදතාවය
4. මූල්‍ය අපහසුතා
5. ආකල්පමය ගැටලු

කසෙේවෙතත් රාජ්‍ය ආයතන මගින් ආබාධ සහිත පුද්ගලයින්ට සපයන සේවාවන්ගේ ගුණාත්මකබව ඉහල දැම්ම, අහිතකර හෞතික ප්‍රවේශයන්ගේ ඇති බලපෑම අඩු කිරීම සහ ආබාධ සහිත පුද්ගලයන් බලගැන්වීමලෝ නව තාක්ෂණික දැනුමට කල හැකි සේවය අතිමහත් ය. එබැවින් ඒ සම්බන්ධයනේ රාජ්‍ය ආයතන සහ නිලධාරීන්ගේ අවධානය යොමුවීම වැදගත් බව මමෙ වාර්තාවේ අදහසයි.

8. අභියෝග සහ යෝජනා

මමෙ පරිච්ඡේදයේ අරමුණ වන්නේ උක්ත අධ්‍යනය හරහා එක් රැස කර ගත් දත්ත මගින් හඳුනා ගන්නා ලද, මමෙ රාජ්‍ය ආයතනයන්හී ප්‍රවේශ පහසුකම් සම්බන්ධ සාධාරණ පිවිසුම කරෙහි පවතින අභියෝග අවබෝධ කර ගැනීම යි. තව දුරටත් එම අභියෝග ආමන්ත්‍රණය කිරීමේදී හඳුනා ගත හැකි විසඳුම් පිළිබඳ කතිකාවතක නිරතවීමට මමෙ පරිච්ඡේදය උත්සාහ ගති. උක්ත කතිකාවත ප්‍රධාන උපමාතෘකා දකෙක් ඔස්සේ මහෙයෙවීමට අදහස් කරයි.

1. සාධාරණ ප්‍රවේශය තහවුරු කිරීම සම්බන්ධයනේ රාජ්‍ය නිලධාරීන් සහ එම ආයතන මගින් සේවා ලබාගත් ආබාධ සහිත කාන්තාවන් හඳුනාගත් අභියෝග.
2. අධ්‍යනය හරහා ප්‍රවේශ පහසුකම් වර්ධනය සම්බන්ධයනේ හඳුනාගත් ගැටලු.

8.1 රාජ්‍ය නිලධාරීන් සහ සේවාලාබීන් විසින් මතු කළ අභියෝග

අධ්‍යනයේ දත්ත විමසා බැලීමේදී පනේ යන්නේ බොහොමයක් රාජ්‍ය නිලධාරීන් විසින් ප්‍රතිපාදනයන්හි සීමාසහිතභාවය මූලික අභියෝගයක් ලෙස හඳුනාගත් බවය. නිදසුනක් වශයෙන් සම්මුඛ සාකච්ඡාවන් සඳහා සහභාගීවූ රාජ්‍ය නිලධාරීන් අතරින් 38%ම ආබාධ සහිත පුද්ගලයන් සඳහා සාධාරණ ප්‍රවේශයක් තහවුරු කිරීමට අවශ්‍ය හෞතිකමය වෙනස්කම් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් තරම් මූල්‍ය ප්‍රතිපාදන නොමැති බව දක්වා සිටින ලදී. උක්ත දත්ත විශ්ලේෂණය මගින් මතුවී පනෙහි මූලික ගැටලු කිහිපයක් තිබේ. එක් අතකින් බැලුවිට බොහොමයක් රාජ්‍ය ආයතන සහ ඕවුන්ගේ ප්‍රතිපත්ති සැකසීම් තුල ආබාධිතතාවය ප්‍රධාන විෂයපතයක් නොවන බව මමෙගින් පනේ යන එක් කරුනකි. අනකේ අතට, ශ්‍රීලංකාව තුල සිදු කරන්නට යදුනු ආබාධ සහිත පුද්ගලයන්ට ඇති සාධාරන ප්‍රවේශය සම්බන්ධ අධ්‍යන බොහොමයක් මූල්‍ය ප්‍රතිපාදන මූලික ගැටලුවක් ලෙස හඳුනා ගන්නා බව පනේ යන කරුනකි. මූල්‍ය පහසුකම් ආශ්‍රය කරගත් ගැටලු, බොහොමයක්වූ දියුණුවමේන් පවතින රාජ්‍යයන්ට පොදුබව සැඟවීමට කරුනක් නොවේ. මහේදි වැදගත් වන තවත් කරුනක් නම් අප විසඳුම් දසෙ බලන කෝනය කොතෙක් දුරට පුළුල්ද යන්නයි . නිදසුනක් වශයෙන් එක් සේවා කව්ලුවක් හරහා ආබාධ සහිත සේවාදුයකයින්ට සේවා ලබාදීම, දෘෂ්‍යාබාධිත පුද්ගලයකුගේ ආධාරයෙන් සේවාදුයකයින්ට අවශ්‍ය වන ලියකියවිලි බ්‍රේල් මාධ්‍යට හැරවීම වැනි ඉතා ප්‍රගතිශීලි විසඳුම් වතෙ ගමන් කල රාජ්‍ය නිලධාරීන් ද අපට මමෙ අධ්‍යනයේදී මුණගැසිනි. මේ ආකාරයට බලන විට පනේ යන්නේ නිර්මාණාත්මක චින්තනය ඔස්සේ මූල්‍ය අපහසුතා මුල් කර ගනෙ පැන නගින ගැටලු ගණනාවක් වලක්වා ගත හැකි බවයි. මේ නිසා ඉහතින් සඳහන් කල පරිදි ශ්‍රී ලංකාව තුල සිදු කරන ලද ආබාධ සහිත පුද්ගලයන්ට ඇති සාධාරන ප්‍රවේශය සම්බන්ධ බොහොමයක් අධ්‍යනයන් මූල්‍ය ප්‍රතිපාදන ආශ්‍රය කරගත් අභියෝගයන් හඳුනා ගන්නා බව පැවසිය හැකිය. දියුණුවමේන් පවතින බොහොමයක් රාජ්‍යන්ට උක්ත අභියෝගයන් පොදු වන අතර, විසඳුම් හඳුනා ගැනීමේදී සහ නව විසඳුම් ඉදිරිපත් කිරීමේදී වඩාත් පුළුල් කෝනයක සිට තීරණ ගැනීමේ වැදගත්කම එමගින් අවධාරනය වේ. එබැවින් ඉහතින් දැක්වූ ආකාරයේ නැවුම්වූ අදහස් අගය කිරීමත්, එවැනි විසඳුම් වඩාත් ප්‍රතිපත්තිමය රාමුවක් ඔස්සේ අනකුත් ආයතනයන් වතෙ හඳුන්වාදීමත් වැදගත් කොට සැලකිය යුතු වේ.

උක්ත අභියෝගය හා ඈදෙන්නාවූ තවත් එක් වැදගත් කරුනක් වන්නේ ආබාධිතතාවය සහ ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයනේ රාජ්‍ය නිලධාරීන් සතු තාක්ෂණික අවබෝධයේ මදකමයි. සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ රාජ්‍ය නිලධාරීන් ම පවසා සිටියේ තාක්ෂණික අවබෝධය අල්පවීම ආබාධ සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතා කරෙහි ප්‍රතිචාර දැක්වීමේදී අභියෝගයක්වී ඇති බවයි. තව දුරටත් දත්ත විශ්ලේෂණයේදී හඳුනාගත් මේ ආශ්‍රිත ගැටලු කිහිපයක් පහත පරිදි වේ.

1. රාජ්‍ය නිලධාරීන් අතර ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ අනපනත් සම්බන්ධයනේ ඇති අවබෝධය අල්ප බව
2. බොහොමයක්වූ පුහුණු වැඩසටහන් ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධ ලබාදී ඇති දැනුම සංඥා භාෂා පුහුණුව වැනි අංශ පමණක් අධ්‍යනය කර ඇති බව. එමගින් පනේ යන්නේ සෑම ආබාධිත තත්වයක් සම්බන්ධයනේ ගැඹුරු දැනුමක් ලබා ගැනීමට මමෙ නිලධාරීන්ට ලැබුනු අවස්ථා අල්ප වන බවයි.

3. පුහුණු වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් ක්‍රමවත් ක්‍රමවේදයක් දක්නට නොලැබේ. වරින් වර පවත්වන ලද පුහුණු වැඩසටහන්ව විනා යම් නිශ්චිත ක්‍රමවේදයක් ඔස්සේ නිලධාරීන් දැනුවත් කිරීමට උත්සාහ ගන්නා බවක් දක්නට නොලැබේ.
4. නව තාක්ෂණික දැනුම රාජ්‍ය නිලධාරීන් වෙත ගෙනයාමට ගත් වෑහෙම් දක්නට ලැබුනේ නැත.

රාජ්‍ය නිලධාරීන් සතු දැනුම වර්ධනය කිරීමහෙලා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන පාර්ශවයන්ගේ උපකාර ලබා ගැනීමේ වැදගත්කමද මහිදී අවධාරණය කල යුතු වේ. මන්ද, සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගිවූ රාජ්‍ය නිලධාරීන් සමහරකේ ආ.කා.සි. ආයතනය විසින් සංවිධානය කල සඤ්ඤා හාෂා පුහුණු වැඩසටහන්වලට සහභාගිවූ බව දක්නට ලැබුනි. උක්ත ආකාරයේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන අතර ඇතිවන්වාවූ සහයෝගී සම්බන්ධතා ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා දායක වනු ඇත. විසේසඤ්ඤ දැනුම සහ සම්පත්දායකත්වය රාජ්‍ය ආයතනයන් වෙත ලබාදීම, සවේච්ඡා වැඩමුලු ආදීවූ විවිධ මැදිහත්වීම් හරහා පරවේශ පහසුකම්හි සාධාරනත්වය දියුණු කිරීම සඳහා පමණක් නොවන, ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා වන වෙනත් ක්ෂේත්‍රයන්හීද මවැනි සම්බන්ධතා මාහැඟි වේ.

8.2 අධ්‍යනය සිදු කිරීමේදී හඳුනාගත් වෙනත් අභියෝග

උක්ත අභියෝග ගනයට ගැනෙන මූලික කරුනක් වන්නේ ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් ඇති සමූහස්ථ දත්තවල අල්ප බවයි. නිදසුනක් වශයෙන් බොහොමයක්වූ නෝරාගත් රාජ්‍ය ආයතන සතුව තම පරදේශයේ ජීවත්වන ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධ නිශ්චිත දත්ත පැවතියේ නැත. මවැනි තත්වයක් පරිපත්ති සැකසීමේදී මෙන්ම සේවා ලබාදීමේදී ඉතා ගැටලුකාරී වේ. මමෙහින් ගම්‍යවන මූලික අවශ්‍යතාවයක් නම් බෙන්ච්මාර්ක්වූ දත්ත පද්ධතියක් ඔස්සේ ආබාධ සහිත පුද්ගලයන් සහ ඔවුන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමන්, එම දත්ත ඉතා පැහැදිලි ක්‍රමවේද ඔස්සේ ගබඩා කර තැබීමන් වේ. විචාරකයන් පවසන පරිදි, එකට එකතු කල දත්තවල හිඟභාවය ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සම්බන්ධයෙන් පවතින මූලිකම අභියෝගයක් බවට වර්තමානයේ පත්වෙමින් පවති. උක්ත ගැටලුවෙම එක් ස්වරූපයක් මමෙ අධ්‍යනයේදීද දක්නට ලැබුනි, එනම් දත්ත හිඟභාවයයි. එමනිසා රාජ්‍ය සහ රාජ්‍ය අංශයන්හී මැදිහත්වීම් හරහා ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධ අධ්‍යනයන් සිදු කිරීම සහ එම දත්ත අන්‍යෝන්‍ය වශයෙන් හොවමාරු කර ගැනීම ඉතා වැදගත් කොට සැලකිය හැකිය. මමෙ වැදගත්කම තවත් තීව්‍ර වන්නේ ආබාධ සහිත කාන්තාවන් පිළිබඳ කරෙනෙ අධ්‍යනයන්වලදී වේ. මන්ද, ඔවුන් සමාජය තුල ද්විත්වික වශයෙන්, එනම් තම ආබාධිතතාවය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය යන කරුනු ද්විත්වය නිසාම සීමාකරණයවූ කණ්ඩායමක් වන හයෙනි. එබැවින් ඔවුන් සම්බන්ධව පවතින දත්ත සීමාකාරී වන අතර, එම යථාර්ථය වඩාත් දැඩි ලෙස අඩු පහසුකම් සහිත දිස්ත්‍රික්කයන්හිදී දැක ගත හැකි වේ.

උක්ත කරුනු හා සම්බන්ධ වන තවත් එක් වැදගත් කරුනක් නම් සේවාදායක රාජ්‍ය නිලධාරීන්ගේ සහ සේවාලාබී ආපාධ සහිත පුද්ගලයන්ගේ දක්නට ලැබෙන ආකල්පයන්ය. පහත දැක්වෙනෙන්ගේ ආබාධ සහිත පුද්ගලයන්ගේ පරවේශ පහසුකම් වැඩි දියුණු කිරීමහෙලා සිදු කල යුතු සාධාරණ පරවේශ පහසුකම් පිළිබඳ රාජ්‍ය නිලධාරීන් විසින් දැක්වූ අදහස් කිහිපයක් ය.

"විශේෂයෙන් හඳුනාගත් ගැටලු නොමැත
ඒ අනුව බොහෝ පියවර අරන් ඇත
එහමෙ විශේෂයෙන් නොමැත".

ඉහත ප්‍රකාශවලින් පැහැදිලි වන මූලික කාරනයක් නම් බොහෝ නිලධාරීන් උක්ත අර්බුදයේ පැවැත්ම පිලිගැනීමට මැලිකමක් දක්වන බවයි. මමෙ ආකල්පය ආබාධ සහිත පුද්ගලයන්ගේ ප්‍රවේශ පහසුකම් වර්ධනය කිරීමේලා හානිදායක වේ. මන්ද ප්‍රශ්නය වටහා ගැනීමට එහි පැවැත්ම පිලිගැනීම අනිවාර්ය වන හයෙනි. තව දුරටත්, මීට පළමුව සාකච්ඡාවට ලක් කරන ලද සේවාදායකයා සහ සේවාලාබීයා අතර ඇති අසමතුලිත බල සම්බන්ධතාවය ද මහේදි වැදගත් වේ. මේ ආකාරයට බලන විට, ප්‍රවේශ පහසුකම් වර්ධනය කිරීමේ මූලික අවශ්‍යතාවයක් වන්නේ රාජ්‍ය නිලධාරීන්ගේ ආකල්ප වෙනස් කිරීමට දායක වීමයි. උක්ත අරමුණ කරෙහි ආබාධිතතාවය සම්බන්ධ අවබෝධය ඉහල නැන්වීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා ඒ ඔස්සේ උක්ත ආකල්පීය ගැටලු සාකච්ඡා කිරීම වැදගත් වේ.

මීට අමතරව, සේවාලාබී ආබාධිත පුද්ගලයන් අතරද ආකල්පමය වෙනසකද දැඩි අවශ්‍යතාවයක් පවතින බව මමෙ අධ්‍යනයේදී පනේ යන ලදි. නිදසුනක් වශයනේ බොහොමයක් ආබාධ සහිත පුද්ගලයන් තම අයිතිවාසිකම් පිළිබඳ අඩු අවධානයක් දරන බවත්, ඒහා බැඳුනු විවිධ දුර්මත අන්තර්ග්‍රහනය කර ගැනිමටත් යොමු වන ආකාරයත් අප මීට ඉහත පරිච්ඡේදයේදී අවබෝධ කර ගත්තමෙු. එබැවින් ආකල්පමීය වෙනසක් උක්ත ආකාරයේ වෙනස්කම් සිදු කිරීමට මූලික අඩිතාලමක් වනු ඇත.

මේ අනුව පනේ යන්නේ ප්‍රවේශ පහසුකම් සාධාරණීකරනය සම්බන්ධ අභියෝග සහ ඒ සඳහා ලබා දිය හැකි විසඳුම් සංකල්පීය මට්ටමක සිට ඉතා ප්‍රායෝගික විසඳුම් දක්වා විහිදනෙ බවයි. උක්ත තත්වය හේතුවෙන් මමෙ එක් එක් විසඳුම දසෙ වඩාත් පුළුල් කෝනයක සිට බැලිමේ අවශ්‍යතාවයක් මතු වේ. මේ සඳහා වැදගත් වන එක් පියවරක් නම් එම අභියෝග සහ විසඳුම් සම්බන්ධ වඩාත් ගැඹුරුවූත්, නිශ්චිතවූත් අධ්‍යනයන් සිදු කිරීමයි.

9. අධ්‍යයන නිර්දේශයන්

මමෙ අධ්‍යයනයේ සොයාගැනීම් මත පදනම්ව ආබාධ සහිත කාන්තාවන්ට රාජ්‍ය සේවා ස්ථාන සහ රාජ්‍ය සේවා ප්‍රවේශය ඉහළ නංවා ගැනිම සඳහා රාජ්‍ය ආයතන සහ රාජ්‍ය ආයතන බලධාරීන් සඳහා පහත නිර්දේශයන් ලබා දිය හැකිය.

1. විධ ආබාධිත තත්ත්වයන් පිළිබඳ සහ ඒ ඒ ආබාධිත තත්ත්වයන්ට අනුව ප්‍රවේශ යටිතලපහසුකම් සැකසිය යුතු ආකාර පිළිබඳ තාක්ෂණික අවබෝධය හා දැනුවත්භාවය ඉහළ නැංවීම
2. ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ ප්‍රවේශය සහ සේවා සඳහා පවතින අයිතිවාසිකම් පිළිබඳ කථිකාවතක් සහ වගවීම පිළිබඳ ඇති දැනුවත් භාවය ඉහළ නැංවීම
3. ප්‍රවේශ පහසුකම් සඳහා පවතින රගුලාසි බලාත්මක කිරීම සඳහා අවශ්‍ය බලධාරීන්ගේ අවධානය යොමු කිරීම

4. ආබාධ සහිත පුද්ගලයින් ගේ ආත්මාභිමානය සහ ගරුත්වය ආරක්ෂා කරමින් සේවා සැපයීම පිළිබඳ ඇති සංකල්පනය නංවාලීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
5. ඒ ඒ සේවා අංශයන්හි නිලධාරී පුහුණු පාඨමාලා තුළට ආබාධ සහිත පුද්ගලයින් සහ කාන්තාවන් සමග කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ පුහුණු පාඨමාලා සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම
6. ඒ ඒ රාජ්‍යායතනයට ඇති ප්‍රවේශ පහසුකම් විමර්ෂණය කළ හැකි ප්‍රවේශතා තක්සේරුවක් සකස් කිරීම සහ එම තක්සේරු වාර්තාවට අනුව ප්‍රවේශ පහසුකම් අඩුලුහුඩුතා සකස් කිරීම
7. ප්‍රවේශ පහසුකම් සකස් කිරීම සඳහා මුදල් වෙන් කිරීම
8. ආබාධ සහිත පුද්ගලයින්ගේ ප්‍රවේශ පහසුකම් වැඩි දියුණු කිරීමටත් ඒ සඳහා අවශ්‍ය උපදේශන ලබා ගැනීම සඳහාත් ප්‍රදේශයේ ඒ සම්බන්ධයෙන් ඇති සංවිධාන, ආබාධ සහිත පුද්ගලයින් සහ විද්වතුන් එක්රැස් කරගත් සහභාගිත්ව කමිටුවක් ආයතනය මට්ටමෙන් හෝ දිස්ත්‍රික්ක මට්ටමෙන් ස්ථාපිත කිරීම සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම

10. සාරාංශය

අනුරාධපුර ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක් පදනම් කර ගනිමින් දියත් කරෙන්නට යදුනු මෙම පර්යේෂණයේ මූලික අරමුණවූයේ එම තෝරාගත් රාජ්‍ය ආයතන වෙත ආබාධ සහිත පුද්ගලයන්ට ඇති සාධාරන ප්‍රවේශය අධ්‍යනය කිරීමයි. මෙම වාර්තාව මගින් පැහැදිලි කළ ආකාරයට ආබාධ සහිත පුද්ගලයින්ගේ ප්‍රවේශ අයිතිවාසිකම් සම්බණ්ධයෙන් වන කතිකාවත දශක කිහිපයක් ඔස්සේ ගොඩනැගී ඇති බව පැහැදිලි වන නමුත්, ප්‍රායෝගික පදනමක පිහිටා එම පහසුකම් කොතෙකුත් දුරට ආබාධ සහිත පුද්ගලයන්ට රාජ්‍ය හෝ පුද්ගලික ආයතනයන් මගින් සපයන්නේද යන්න අධ්‍යනය කරන සිද්ධි අධ්‍යනයන්ගේ පැහැදිලි අඩුවක් දක්නට තිබේ. එම අඩුව පුරවාලමින් තෝරාගත් රාජ්‍ය ආයතන 26ක් සහ එම ආයතන වෙත ඇති සාධාරන ප්‍රවේශය මෙම වාර්තාව මගින් අධ්‍යනය කරන්නට යදුනි. උක්ත ව්‍යායාමය තුලදී වඩාත් පුළුල් පසුබිමක පිහිටා ප්‍රවේශ පහසුකම් අර්ථ දැක්වීමට මෙම අධ්‍යනය උත්සාහ ගන්නා ලදී. බහුතරයක්වූ ප්‍රවේශ පහසුකම් සම්බන්ධ ශ්‍රී ලාංකිය සිද්දි අධ්‍යනයන් බොහෝ විට "ප්‍රවේශය" යන සංකල්පය එතරම් පුළුල් කෝණයක සිට නිර්වචනය කර ඇති බවක් දක්නට නොලැබේ. මතෙකේ දක්නට ලැබුනු බොහෝ අධ්‍යනයන්ට වඩා පියවරක් ඉදිරියට යමින් මෙම අධ්‍යනය ප්‍රවේශය යන්න යටිතල පහසුකම් කරෙහි ඇති භෞතික ප්‍රවේශය ඉක්මවා යන්නක් බව අවධාරණය කරමින්, තොරතුරු සඳහා වන ප්‍රවේශය, මානව සම්පතට ඇති ප්‍රවේශය සහ නව තාක්ෂණික ක්‍රමෝපායන් කරෙහි ඇති පිවිසුම වැනි අංශයන් වෙත ද අවධානය යොමු කරන ලදී.

මේ ආකාරයට වඩාත් විස්තෘත කෝනයක සිටිමින් එක් රැස් කර ගක් දත්ත අධ්‍යනය මගින් මෙම වාර්තාව අවබෝධ කර ගත්තේ රාජ්‍ය ආයතනයන් කරෙහි ආබාධ සහිත පුද්ගලයන්ට ඇති සාධාරන ප්‍රවේශය සතුටුදායක නොවන බවයි. යම් යම් මූලික පියවර ගෙන තිබුනද, සමස්ථයක් වශයෙන් එය අල්පතරයක් වන බව අධ්‍යන දත්ත ඔස්සේ පැහැදිලි වන කරුනකි. තව දුරටත්, උක්ත යථාර්ථය හේතුවෙන් ආබාධ සහිත පුද්ගලයන් මුහුණදෙන විවිධ ආකාරයේ ගැටලු හඳුනාගත් මෙම අධ්‍යනය, එම ගැටලු ඉතා ප්‍රායෝගික තලයක සිට සාංකල්පීය මට්ටමක් දක්වා පැතිරෙන බව පෙන්වා දෙන ලදී. යම් සේවාවකට ඇති ප්‍රවේශයේදී සීමාකරණයට

ලක්වීමේ සිට තමා සම්බන්ධයෙන්වූ සාමාජිය දුර්මත අන්තර්ග්‍රහනය කර ගැනීම දක්වාවූ වඩාත් පැතිරී ගිය රාමුවක් තුල මමෙ ප්‍රතිවිපාක දක්නට ලැබනෙ බව මමෙ වාර්තාව අවබෝධ කර ගන්නා ලදි.

තව දුරටත්, ප්‍රවේශ පහසුකම් කරෙහේ ඇති සාධාරන පිවිසුම ඉහල නැන්වීමේදී මුහුණදීමට සිදු වන විවිධ අභියෝග හඳුනා ගැනිමටද මමෙ අධ්‍යනය වෑයම් දැරීය. විශේෂයෙන්ම, සේවාදායක රාජ්‍ය නිලධාරීන් මනෙම සේවාලාබී ආබාධ සහිත පුද්ගලයන් තුල දක්නට ලැබනෙ ඍනාත්මක ආකල්ප, සමූහිත දත්තවල මදකම, ආබාධිතතාවයන් සම්බන්ධයනේ නිලධාරීන් සතු අල්ප දැනුම ආදී කරගත් අභියෝග ගණනාවක් මේ ඔස්සේ හඳුනා ගන්නා ලදි. තව දුරටත් රාජ්‍ය නිලධාරීන් ආබාධිත පුද්ගලයන්ගේ අවශ්‍යතා කරෙහේ සංවේදී කිරීමේ සිට වඩාත් ශක්තිමත් ප්‍රතිපත්ති රාමු සකස් කිරීම දක්වා පැතිර යන විසඳුම් රාමුවක අවශ්‍යතාවය හඳුනා ගන්නා මමෙ අධ්‍යනය, එම විසඳුම් ක්‍රියාවට නැන්වීමේදී රාජ්‍ය මනෙම රාජ්‍ය නොවන ආයතනයන්ගේ සහයෝගීතාවයේ වැදගත්කමද සාකච්ජාවට ලක් කරයි. තව දුරටත් මමෙ අධ්‍යනය වැනි අධ්‍යනයන් වැඩි දුරටත් සිදු කිරීමත්, වඩාත් නිශ්චිත අරමුණු සහ අංශයන් ඔස්සේ නව අධ්‍යන සිදු කිරීමත් වැදගත් ලසෙ මමෙ අධ්‍යනය පතේවා දයෙි. උක්ත ආකාරයේ අධ්‍යනයන් සඳහා මමෙ අධ්‍යනය සහ එහි වාර්තාව මාර්ගෝපදේශනයක් වනු ඇතැයි යන්න අපගේ විශ්වාසයයි.

ඇමිනුම්

ඇමිනුම 1- සම්මුඛ සාකච්ඡා සඳහා යොදු ගත් ප්‍රශ්නාවලිය

රාජ්‍ය **ආයතන** සහ **ඒවයෙන්** සැපයනෙ සේවාවන්ට **ආබාධ** සහිත කාන්තාවන්ට ප්‍රවේශ**වීමට ඇති** හැකියාව සහ එය වැඩිදියණු කළ හැකි **ආකාර** පිළිබඳ අධ්‍යයනය

ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය

දිනය -
ප්‍රශ්ණාවලිය මහෙයෙවන අයගේ නම -
ආයතනයේ නම -
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -

සාකච්ඡාව මගින් තොරතුරු එක්රැස් කිරීම

සාකච්ඡාවට සහභාගි වූ ආයතන නිලධාරියා/නිලධාරීන් සහ ඔවුන්ගේ තනතුර

නිලධාරියාගේ නම	තනතුර

1කොටස - සේවා සපයන **ආයතනය,** කාර්යක්ෂම **සේවා** සහ **සේවා** ලාභීන්

1.1 ආයතනය ස්ථාපිත කළ කාල වකවානුව -
1.2 ආයතනය විසින් සැපයනෙ සේවාවන් කවෙියන්ේ

1	
2	
3	
4	
5	
6	
7	
8	

9	
10	
11	
12	

1.3 ආයතනය විසින් සේවා සැපයනෙ භූමි ප්‍රදේශය තුළ සමස්ත ජනගහණය

1.4 ආයතනය විසින් සැපයනෙ සේවාවන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට ආයතනය විසින් ගනෙ ඇති ක්‍රියාමාර්ග
වඩෙ අඩවිය මගින් මුද්‍රිත තොරතුරු පත්‍රිකා මගින් සමාජ මාධ්‍ය ජාලා මගින්
වනෙත් .....
1.5 ආයතනයට දිනකට/මසකට ප්‍රවේශවන සේවාලාභීන් සංඛ්‍යාව (සැකවින්)

1.6 සේවාලාභීන් කබෙදු අයද යන වග (කාන්තා පිරිමි, වයෝවෘද්ධ, තරුණ, ළමා ආදී,)

1.7 සේවා සැපයීමේදී වඩාත් හොඳ සේවාවක් සැපයීම උදසො ආයතනය විසින් ගනෙ ඇති ක්‍රියා මාර්ග
කාර්ය මණ්ඩල පුහුණුව, සේවාවන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, සේවාවන් කඩිනමින් සිදු කිරීම සඳහා ගනෙ ඇති පියවර ආදී)

1.8 සුහද සේවාවක් ලබා දීම සඳහා ගනෙ ඇති පියවර

2 කොටස - විවිධ ආබාධ සහිත කාන්තා සේවාලාභීන්ට සේවා සැපයීම

ආයතනයට පැමිණනෙ සේවා ලාහීන් අතරමින් විවිධ ආබාධ සහිත පුද්ගලයින්ගේ සංඛ්‍යාව හෝ ඔවුන්ගේ ආබාධයෙහි ස්වභාවය හෝ පිළිබඳ ව ආයතනයට යම් අදහසක් තිබෙේද?
ඔව් . නැත .
ඔව් නම්,ඒ මොනවාද? ඒ අතරින් ආබාධ සහිත කාන්තාවන් සිටිද ?

ආයතනය විසින් සේවා සපයන භූමි ප්‍රදේශය තුළ සිටින ජනගහණයනේ විවිධ ආබාධ සහිත ජනගහණය පිළිබඳ ආයතනයට යම් අදහසක් පවති ද?

ඔව්. නැත.

2.1- දෘශ්‍යාබාධිත කාන්තා සේවා ලාහීන්ට හෞතික හා සේවා සඳහා ඇති ප්‍රවේශය

2.1.1 දෘශ්‍යාබාධ සහිත කාන්තාවකට සේවා සැපයීමේදී ලැබූ අත්දැකීම් තිබෙේද? තිබෙනම් එම අත්දැකීම් කබෙදුද (කුමන සේවාවන් ද එම සේවා සැපයූ ආකාරය සමාන්‍ය සේවා සැපයීමකට වඩා වනෙස් වූවක් ද)
ඔව් නැත
ඔව් නම්,ඒ මොනවාද විස්තර කරන්න .

2.1.2 ඔබගේ ආයතනය විසින් ලබා දනෙ සේවාවන් පිළිබඳ තොරතුරු සහ දැන්වීම් පුවරු මගින් ලබාදනෙ තොරතුරු දෘශ්‍යාබාධ සහිත සේවාලාභී කාන්තාවන්ට ලබා ගත හැකි වන්නේ කසෙේද?

2.1.3 දෘශ්‍යාබාධ සහිත සේවා ලාභී කාන්තාවන්ට ඔබ ආයතනය විසින් සැපයනෙ සියලුම සේවා ගැටලුවකින් තොරව ප්‍රවේශ විය හැකි ද?

ඔව්, සියලු සේවාවන්ට දෘශ්‍යාබාධ සහිත සේවා ලාභීන්ට ප්‍රවේශවිය හැකිය

නැත, කිසිදු සේවාවකට දෘශ්‍යාබාධ සහිත සේවා ලාභීන්ට ප්‍රවේශවිය නොහැකිය

ඇතැම් සේවාවන්ට පමණක් ප්‍රවේශවිය හැකිය

ගැටලුවකින් තොරව ලබා ගත හැකි සේවා	දෘශ්‍යාබාධ සහිත පුද්ගලයකුට ලබා ගත නොහැකි සේවාවන්	ප්‍රවේශවීමට නොහැකි හේතුව/ හේතූන්

2.1.4. සේවා සැපයීමට නොහැකි අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයනේ කටයුතු කරන ආකාරය පැහැදිලි කරන්න.

.....

.....

2.1.5 දෘශ්‍යාබාධ සහිත කාන්තා සේවාලාභීන්ට ප්‍රවේශවිය නොහැකි සේවාවන්ට ප්‍රවේශය ලබා දීමට ආයතනය විසින් ගත හැකි ක්‍රියාමාර්ග පවති ද එසේ කිරීමට පවතින අභියෝග මොනවාද?

2.1.6.ආයතනය තුළ පවතින ප්‍රධාන සේවා සැපයනෙ කවුලු/අංශ සංඛ්‍යාව කොපමණ ද? දෘශ්‍යාබාධ සහිත සේවාලාභීන්ට ආයතනයට ඇතුළුවීමට සහ ඒහි විවිධ සේවා ස්ථාන වනෙ යාමට අවශ්‍ය හනෙික පහසුකම් පවති ද? (මාර්ගෝපදේශක ගල් සවිකිරීම, සංඥා කැපී පනෙනෙ වර්ණ වලින් යුක්ව දැක්වීම, ආදී)

සංඛ්‍යාව-

සේවා සැපයනෙ අංශය	දෘශ්‍යාබාධ සහිත පුද්ගලයකුට අවශ්‍ය හෞතික පහසුකම් සපුරා ඇති/නැති බව

2.2- ශ්‍රව්‍යාබාධිත සේවා ලාභීන්ට සේවා සඳහා ඇති ප්‍රවේශය

2.2.1 ශ්‍රව්‍යාබාධ සහිත පුද්ගලයින්ට සේවා සැපයීමේදී ලැබූ අත්දැකීම් තිබේද? තිබේනම් එම අත්දැකීම් කෙබඳුද (කුමන සේවාවන් ද එම සේවා සැපයූ ආකාරය සමාන්‍ය සේවා සැපයීමකට වඩා වෙනස් වූවක් ද)

තිබේ. ☐ නොතිබේ. ☐

තිබේ නම්,ඒ මොනවාද විස්තර කරන්න .

2.2.2 ඔබගේ ආයතනයහි සංඥා භාෂාවෙන් සේවා සැපයිය හැකි නිලධාරීන් සිටිද?

ඔව්. ☐ නැත. ☐

2.2.3 ආයතනය විසින් ලබා දෙන සේවාවන් පිළිබඳ තොරතුරු සහ දැන්වීම් පුවරු මගින් ලබාදෙන තොරතුරු ශ්‍රව්‍යාබාධ සහිත සේවාලාභීන්ට ලබා ගත හැකි වන්නේ කෙසේද?

2.2.4 ශ්‍රව්‍යාබාධ සහිත සේවා ලාභීන්ට ඔබ ආයතනය විසින් සැපයෙන සියලුම සේවා ගැටලුවකින් තොරව ප්‍රවේශ විය හැකි ද?

ඔව්, සියලු සේවාවන්ට ශ්‍රව්‍යාබාධ සහිත සේවා ලාභීන්ට ප්‍රවේශවිය හැකිය ☐

නැත, කිසිදු සේවාවකට ශ්‍රව්‍යාබාධ සහිත සේවා ලාභීන්ට ප්‍රවේශවිය නොහැකිය ☐

ඇතැම් සේවාවන්ට පමණක් ප්‍රවේශවිය හැකිය ☐

ගැටලුවකින් තොරව ලබා ගත හැකි සේවා	ශ්‍රව්‍යාබාධ සහිත පුද්ගලයකුට ලබා ගත නොහැකි සේවාවන්	ප්‍රවේශවීමට නොහැකි හේතුව/ හේතූන්

2.2.5 සේවා සැපයීමට නොහැකි අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් කටයුතු කර ආකාරය පැහැදිලි කරන්න.

.....

.....

2.2.6 ශ්‍රවණාබාධ සහිත සේවාලාභීන්ට ප්‍රවේශවිය නොහැකි සේවාවන්ට ප්‍රවේශය ලබා දීමට ආයතනය විසින් ගත හැකි ක්‍රියාමාර්ග පවතී ද එසේ කිරීමට පවතින අභියෝග මොනවාද?

2.3- වලනාබාධ සහිත සේවා ලාභීන්ට සේවා සඳහා ඇති ප්‍රවේශය

2.3.1 වලනාබාධ සහිත පුද්ගලයින්ට සේවා සැපයීමේදී ලැබූ අත්දැකීම් තිබේද? තිබේනම් එම අත්දැකීම් කෙබඳුද (කුමන සේවාවන් ද එම සේවා සැපයූ ආකාරය සමාන්‍ය සේවා සැපයීමකට වඩා වෙනස් වූවක් ද)

2.3.2 වලනාබාධ සහිත සේවා ලාභීන්ට ඔබ ආයතනය විසින් සැපයනෙ සියලුම සේවා ගැටලුවකින් තොරව ප්‍රවේශ විය හැකි ද?

☐ ඔව්, සියලු සේවාවන්ට වලනාබාධ සහිත සේවා ලාභීන්ට ප්‍රවේශවිය හැකිය

☐ නැත, කිසිදු සේවාවකට වලනාබාධ සහිත සේවා ලාභීන්ට ප්‍රවේශවිය නොහැකිය

☐ ඇතැම් සේවාවන්ට පමණක් ප්‍රවේශවිය හැකිය

ගැටලුවකින් තොරව ලබා ගත හැකි සේවා	වලනාබාධ සහිත පුද්ගලයකුට ලබා ගත නොහැකි සේවාවන්	ප්‍රවේශවීමට නොහැකි හේතුව/ හේතූන්

2.3.4.සේවා සැපයීමට නොහැකි අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් කටයුතු කර ආකාරය පැහැදිලි කරන්න.

.....

.....

.....

2.3.5 වලනාබාධ සහිත සේවාලාභීන්ට ප්‍රවේශවිය නොහැකි සේවාවන්ට ප්‍රවේශය ලබා දීමට ආයතනය විසින් ගත හැකි ක්‍රියාමාර්ග පවතී ද එසේ කිරීමට පවතින අභියෝග මොනවාද?

2.3.6 ආයතනය තුළ පවතින ප්‍රධාන සේවා සැපයනෙ කවුලු/අංශ සංඛ්‍යාව කොපමණ ද? චලනාබාධ සහිත සේවාලාභීන්ට ආයතනයට ඇතුළුවීමට සහ ඒහි විවිධ සේවා ස්ථාන වතෙ යාමට අවශ්‍ය භෞතික පහසුකම් පවති ද? (රෝද පුටු, අත්වාරු හා අවිදිමේ ආධාරක වැනි සංවරන උපකරණ භාවිත කරන්නන්ට යා හැකි බෑවුම් සහිත ප්‍රවේශ මාර්ග (ramp) අන්වැට, විදුලි සෝපාන, රෝද පුටු හසුරුවිය හැකි ප්‍රමාණයේ ඉඩ ආදී,)
සංඛ්‍යාව-

සේවා සැපයනෙ අංශය	චලනාබාධ සහිත පුද්ගලයකුට අවශ්‍ය භෞතික පහසුකම් සපුරා ඇති/නැති බව

3 කොටස - ආබාධ සහිත සේවාලාභීන්ට ප්‍රවේශ පහසුකම් හා සේවා සැපයීමේ අභියෝග

3.1.1 ආබාධ සහිත පුද්ගලයින්ට /කාන්තාවන්ට සේවා සැපයීමේදී ආයතනය මුහුණ දනෙ ගැටලු මොනවාද? අදාළ සියල්ල ලකුණු කරන්න. මින් වඩාත් ප්‍රබලව බලපාන අභියෝගය කුමක්ද (ඊට අදාළ කොටුව ඉදිරියේ තරු ලකුණ යොදන්න.)

- ඒ ඒ ආබාධිතබාවයට අනුව අවශ්‍ය අයුරින් භෞතික සහ අනකුත් ප්‍රවේශ පහසුකම් සැකසීමේ තාක්ෂණික දැනුම නොමැති කම
- අවශ්‍ය ප්‍රතිපාදන නොමැති කම
- ආබාධ සහිත කාන්තාවන් සේවා දායකයින් ලසෙ ඉදිරිපත් නොවීම
- ආබාධ සහිත කාන්තා සේවාලාභීන්ගේ අවශ්‍යතා හා ඔවුන් පිළිබඳ සංවේදී විය යුත්තේ කසෙේද යන්න පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති වීම
- .....
- .....

4 කොටස - විවිධ ආබාධ සහිත සේවා ලාභීන්ට සේවා සැපයීම සම්බන්ධයනේ පුහුණු, වැඩසටහන් හෝ දැනුවත්බාවය

4.1.1 විවිධ ආබාධ සහිත පිරිමින් සහ ගැහැණු සේවා ලාභීන්ට සේවා සපයන ආකාරය සහකම්පනය හා ඔවුන්ගේ අයිතින් ආදී කරුණු සම්බන්ධයනේ කාර්යමණ්ඩලය පුහුණු හෝ දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහභාගීව ඇත්ද?

	වැඩටසහන	වැඩසටහන සංවිධානය කළ ආයතනය	සහභාගි වූ කාර්යමණ්ඩල සංඛ්‍යාව

විවිධ ආබාධ සහිත කාන්තාවන්ට මමෙ ආයතනයට ප්‍රවේශවීමේදී සහ සේවා ලබා ගැනීමේදී ඔවුනට ආරක්ෂිත බවක් දැනෙන ආකාරයට ආයතනික පසුබිම සැකසිඇතැයි ඔබ සිතන්නේද?

වඩාත් ආරක්ෂිතයි
ආරක්ෂිතයි
නොදනී
අනාරක්ෂිතයි

1.4.2 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත පිළිබඳ පනතට අනුව ප්‍රවේශය ඉහළ නැංවීමට හැකි ආකාර පිළිබඳ අදහස් මොනවාද? ඒ සඳහා අවශ්‍ය වන්නේ කිනම් සහායක් ද?

ඇමිනුම 2- සිද්දි අධ්‍යනයන් සඳහා යොදු ගත් ප්‍රශ්නාවලිය

Questionnaire for Case Studies

The objective of this questionnaire/interview is to understand the experiences of women with disabilities in obtaining services from selected government offices in the Anuradhapura district. Participation for this interview is purely voluntary, and you are invited to share your ideas freely. No information shared during this interview will be published in any way that you can be identified as an individual.
මමෙ ප්‍රශ්නාවලියේ/ සම්මුඛ සාකච්ජාවේ පරමාර්ථය වන්නේ ආබාධ සහිත කාන්තාවන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරා ගත් රජයේ කාර්යාලවලින් සේවා ලබා ගැනිමේදී ලද අත්දැකිම් අවබෝධ කර ගැනිමයි. මමෙ සම්මුඛ සාකච්ජාවට සහභාගි වීම සම්පූර්ණයෙන්ම ස්වේච්ඡා පදනමක් ගන්නා අතර, ඔබේ අදහස් නිදහසේ බෙදා ගැනිමට ඔබට ආරාධනා කරෙේ. මමෙ සම්මුඛ සාකච්ජාව අතරතුර හොවමාරුවූ කිසිදු තොරතුරක් ඔබ පුද්ගලයකු ලෙස හඳුනාගත හැකි ආකාරයෙන් ප්‍රකාශයට පත් නොකෙරේ.

Section I: personal information
පළමු කොටස: පුද්ගලික තොරතුරු

1. Can you tell us something about yourself? Some information about your age, village, job, marital status ETC?

ඔයා ගැන විස්තර ටිකක් අපිට කියන්න පුලුවන්ද? ඔයාගේ වයස, ගම, රැකියාව, විවාහ තත්ත්වය වගේ විස්තර ටිකක්?

2. Can you describe your disability to us?

ඔයාට ඔයාගේ ආබාධිතතාව ගැන අපට විස්තර කරන්න පුලුවන් ද?

3. Do you have any especial requirements arising from your disability?

ඔයාගේ ආබාධිතභාවය නිසා ඇති වන විශේෂ අවශ්‍යතා මොනවා හරි ඔයාට තියනවාද?

Section II: Experiences of obtaining services from the selected government office
දවෙන කොටස: තෝරාගත් රජයේ කාර්යාලයනේ සේවා ලබා ගැනිමේදී ලද අත්දැකිම්

4. What is the government office that you reached out to obtain service/s?

සේවා ලබා ගැනිමට ඔයා ගියපු රජයේ කාර්යාලය මොකක්ද?

5. Can you tell us about the specific service/s that you wanted to obtain from this government office?

ඔයාට මමෙ රජයේ කාර්යාලයනේ ලබා ගන්නට උවමනාවූ සේවාවන්/සේවා ගැන අපට කියන්න පුලුවන්ද?

6. Can you explain us your experience of obtaining services from this government office?

මමෙ රජයේ කාර්යාලයනේ සේවා ලබා ගැනිමේ ඔයාගේ අත්දැකිම් අපට විස්තර කරන්න පුලුවන්ද?

7. How would you explain the physical access to the government office that you obtained services from?

ඔයා සේවා ලබා ගත් රජයේ කාර්යාලයට තිබුනු භෞතික ප්‍රවේශය ගැන ඔයාට විස්තර කරන්න පුලුවන් කොහොමද?

8. Can you explain how you accessed information during your visit to this government office? Information includes forms, name boards, applications ETC.

ඔයා මමෙ රජයේ කාර්යාලයට ගිය අවස්ථාවේදී ඔයා තොරතුරු ලබා ගත් ආකාරය පැහැදිලි කරන්න පුලුවන්ද? තොරතුරු යන්නනේ අදහස් කලේ පෝරම, නාම පුවරු, අයදුම්පත්‍ර ආදිය.

9. Can you tell us about the staff of this government office and the role that they played when providing you the required services?

මමෙ රජයේ කාර්යාලයේ කාර්ය මණ්ඩලය ඔයාට උවමනා සේවාවන් සැපයීමේදී සිදු කළ කාර්යභාරය ගැන අපට විස්තර කරන්න පුලුවන්ද?

Section III: Perceptions of the services received
තවෙන කොටස: ලැබුණු සේවාවන් පිළිබඳ අදහස්

10. Do you often obtain services from government offices?

ඔයා නිරන්තරයනේ රජයේ කාර්යාලවලින් සේවාවන් ලබා ගන්නවාද?

10.1. If Yes:

What are the government offices that you often reach out to? Can you explain your experience of obtaining services from them?
ඉහත ප්‍රශ්නයට පිලිතුර ඔව් නම්:
ඔයා නිතරම සම්බන්ධ වන රජයේ කාර්යාල මොනවාද? ඔවුන්ගනේ සේවා ලබා ගැනිමේ ඔයාගේ අත්දැකිම් අපට පැහැදිලි කරන්න පුලුවන්ද?

10.2. If not:

Are there any reasons that led you not to reach out to government offices to obtain services?
ඉහත ප්‍රශ්නයට පිලිතුර නැත නම්
ඔයා සේවා ලබා ගැනිමට රජයේ කාර්යාල වනෙ නොපැමිණීමට බලපෑ මොනවා හෝ හේතු තියනවාද?

11. Would you say your experience with obtaining services from this government office) motivated you to go back to that office in future?

මමෙ රජයේ කාර්යාලයනේ සේවා ලබා ගැනිමේදී ඔයා ලබපු අත්දැකිම් නැවත සැරයක් එම කාර්යාලයනේ සේවා ලබා ගන්න ඔයාව පලෙඹවූවා කියලා ඔයා හිතනවාද?

11.1. If yes: explain why?
ඉහත ප්‍රශ්නයට පිලිතුර ඔව් නම්, ඒ ඇයිදැයි පැහැදිලි කරන්න පුලුවන්ද?

11.2. If not: explain why?

ඉහත ප්‍රශ්නයට පිලිතුර නැත නම්, ඒ ඇයිදැයි පැහැදිලි කරන්න පුලුවන්ද?

12. As a woman, do you think that your gender impacted your ability to obtain services from this government office?
ඔයා හිතනවාද ඔයා කාන්තාවක් වීම මමෙ රජයේ කාර්යාලයනේ සේවා ලබා ගැනීමට ඔයාට තිබුනු හැකියාවට යම් බලපෑමක් (හොඳ හෝ නරක) වුනා කියලා?

13. Do you have any suggestions to improve the services that are provided by this government office to women with disabilities?

ආබාධ සහිත කාන්තාවන් සඳහා මමෙ රජයේ කාර්යාලය මගින් ලබා දනෙ සේවාවන් වැඩිදියුණු කිරීමට ඔයාට යෝජනා මොනවා හරි තියනවාද?

14. Do you have any suggestions to improve the services provided by the government offices in your area to women with disabilities?

ආබාධ සහිත කාන්තාවන් සඳහා ඔබේ ප්‍රදේශයේ රජයේ කාර්යාල මඟින් ලබා දනෙ සේවාවන් වැඩිදියුණු කිරීමට ඔයාට යෝජනා මොනවා හරි තියනවාද?

15. Do you have anything else to share with us?
ඔයාට වනෙ මොනවා හරි අපිට කියන්න තියනවාද?